Berghof
Research Center
Forschungszentrum
for Constructive
für konstruktive
Conflict Management
Konfliktbearbeitung

# පුවත් මාධ්‍ය සහ ජනවර්ගීය දේශපාලන ගැටුම් ව්‍යාවර්තනය

ඩුසන් රෙල්ජික් (Dusan Reljic)

www.berghof-handbook.net




1. හැඳින්වීම 410

2. ඒකමතික (සමූහ සංගතික) ප්‍රජාතන්ත්‍රවාදය 411

3. මාධ්‍ය පද්ධතිය තුළ තීරණාත්මක සාධක 419

4. ගැටුම් ව්‍යාවර්තනය සඳහා බාහිර පරිශ්‍රම 423

ජාත්‍යන්තර සංවිධානවල ක්‍රියාකාරකම් සහ රාජ්‍ය නොවන සංවිධාන

'මාධ්‍ය නිදහස' එරෙහිව 'මාධ්‍ය පාලනය' 423

ජාත්‍යන්තර නීතිය පවසන්නේ කුමක්ද? 423

ප්‍රකාශන නිදහස සහ මාධ්‍යකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරකම් 428

බලහත්කාර 'තොරතුරු මැදිහත්වීමේ' සීමාවන් 429

5. නිගමනය 432

6. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියවීම් 434


©2006 Berghof Research Center for Constructive Conflict **Management**

# පුවත් මාධ්‍ය සහ ජනවර්ගීය දේශපාලන ගැටුම් ව්‍යාවර්තනය

දුෂාන් රෙල්ජික් (Dusan Relijic)

## 1. හැඳින්වීම

බොහෝ ජනමාධ්‍යවේදීන්ට ගැටුම් ගැන වාර්තා කිරීම අනුපම වූ රීති සමූහයකින් පාලනය කරනු ලබන විශේෂ අවස්ථාවක් නොවේ. තත්ත්වය ඇත්ත වශයෙන්ම ඊට හාත්පසින්ම වෙනස් වූවකි: දේශපාලන, ආර්ථික සහ සමාජයක අභ්‍යන්තරයේ අපේක්ෂා පදනම් කරගත් වෙනත් ගැටුම් ගැන වාර්තා කිරීම ජනමාධ්‍යවේදියකුගේ එදිනෙදා චර්යාවේ අංගයකි. සාමාන්‍යයෙන් ගත් කල ගැටුම් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක එදිනෙදා ජීවිතයේ ලක්ෂණයකි. ඒ අනුව මාධ්‍යයෙහි ගැටුම් පිළිබඳ වාර්තා නොමැතිවීම ප්‍රජාතන්ත්‍රවාදය නැතිවී යාමක් සේ හැඟෙන්නට පුළුවන.

ජනවාර්ගීය දේශපාලන ගැටුම් වෙනත් ආකාරයේ දේශපාලන ගැටුම්වලටට වඩා වැදගත් අංශ කිහිපයකින්ම වෙනස් වේ. මූලික වෙනස්කම වන්නේ අනිකුත් වාර්ගික ප්‍රජාවන් සමග තිබෙන මැසිවිලි විසඳා ගැනීමට ඇති එකම මාර්ගය ප්‍රචණ්ඩත්වය යයි තීරණය කොට ගැටුමට සම්බන්ධ පාර්ශ්වයන් එම මඟට එළැඹීමයි. මෑත වර්ෂ තුළ දී යුරෝපය නැවත වරක් ජනවර්ගීය දේශපාලන ගැටුම් සෑහෙන ප්‍රමාණයක් අත්දැක තිබේ. මෙය විශේෂයෙන් මධ්‍යම සහ නැගෙනිර යුරෝපයේ ඒකාධිපති පාලන බිඳ වැටීමෙන් පසුවය.



කෙසේ වුවද, ප්‍රත්‍යක්ෂවම ජාතිකත්වය කිසිවිටෙකවත් නැගෙනහිර හෝ ගිනිකොණ දිග යුරෝපයට සීමා වූ දෙයක් වශයෙන් නොපෙනේ. බටහිර යුරෝපයේ ද, විදේශිකයන් නොරිස්සීම, ජාතිවාදය හෝ වාර්ගික ජාත්‍යාලය වැනි ජාතිකත්ව හැඟීම් උත්සන්න කිරීම සෑහෙන කාර්යභාරයක් මාධ්‍ය මගින් ඉටු කරනු ලබයි. ඊළඟ වසර කීපය තුළ දී යුරෝපයට සංක්‍රමණිකයින්ගේ පැමිණීම වැඩිවන විට මෙම ජනවාර්ගීය දේශපාලන ගැටුම් වැදගත් තැනක් ගැනීමට ඉඩ තිබේ. යුරෝපා සංගමය (EU) වැනි ජාතික සීමා ඉක්මවන ආයතන නිර්මාණය කිරීම හා ප්‍රසාරණය ජාතිකවාදයට එරෙහි ප්‍රතිවරුද්ධ ක්‍රියාවලියක් සහ එය අවම කිරීමට හෝ නැතිනම් නැති කර දැමීමට සැලසුම් කරන දෙයක් බවට පත් විය හැකි අතර, ජාතිකත්වවාදී ආතති යුරෝපීය දේශපාලනයේ කේන්ද්‍රීය කාර්යභාරයක් නොකඩවා ඉටු කරන අතර. ජනමාධ්‍ය තුළ ද එය ඒ ආකාරයෙන්ම සිදුවනු ඇත.

ජාතිකත්වවාදයේ අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් කෙරෙන බොහෝ පර්යේෂණවලට ආරම්භක ලක්ෂ්‍ය වන්නේ මධ්‍යගත සන්නිවේදන, සමාජ සංචලතාව සහ ආර්ථික සම්බන්ධතා ඉහළ තලයන්හි පවත්වාගෙන යාම සහ එම කාරණාවලදී ජනතාවගේ විවිධ කොටස් අතර තිබෙන සංස්කෘතික වෙනස්කම් අභිබවා යාමට හැකිය යන මතයයි. ඒ හේතු කොට ගෙන සජාතීය ලක්ෂණ සහිත සංස්කෘතියක් අභිවර්ධනය කළ හැකි යැයි සැලකේ (ගෙල්නර් 1953). කෙසේ වුවද, වර්ධනය කරන ලද සන්නිවේදනයට ඇත්ත වශයෙන්ම ඊට හාත්පසින්ම ප්‍රතිවිරුද්ධ වූ ප්‍රතිඵල ලබාදිය හැකි බවට ද ලකුණු ඇත. සමහරවිට එසේ වන්නේ සමාන තත්වයන් වර්ධනය වූ සංස්කෘතීන් කිහිපයක් යාබදව පවතින

ප්‍රදේශවලය. මෙය සිදුවන්නේ දියුණු කරන ලද සන්නිවේදන සහ ගමනාගමනය, කුඩා කණ්ඩායම්වලට අත්වන අය තුළ තමන් වෙනස්ය යන හැඟීමක් බලවත්වීම නිසාය (Connor 1994). ඒ අනුව ලෝකය පුරාම වාර්ගික ආතතී සහ බෙදීම පදනම් කරගත් ඉල්ලීම් වැඩි වෙමින් පැවතීම ගැන පුදුම විය යුතු නැත.

වාර්ගික වශයෙන් විවිධත්වයක් ඇති සමාජ තුළ තිබෙන වෙනස්කම් ප්‍රතිබල කිරීම සඳහා මාධ්‍ය බොහෝ විට දායක වෙයි. ඒ හේතුකොට ගෙන ජනතාව තුළ තිබෙන සජාතීයත්වය කෙරෙහි බෙදා වෙන් කිරීමේ බලපෑම වැඩි කරවයි. එවිට මුඛ්‍ය කාරණය වන්නේ ඇන්තනි ගිඩන්ස් යෝජනා කරන පරිදි වාර්ගික ප්‍රජාවන් අතර, සන්නිවේදනයේ 'නිෂේධක සර්පිල වර්ධනය' වී අවසානයේ දී ප්‍රචණ්ඩත්වය දක්වා පරිහානියට යන්නේ කුමනාකාර අවස්ථා යටතේද? (ක්‍රෝධය තෙක් පරිහානියට පත් වී මහත් වූ ක්‍රෝධයක් පෝෂණය කරනු ලබන අන්‍යෝන්‍ය නිෂේධක හැඟීම්). තවදුරටත් "එකිනෙකට වෙනස් ප්‍රජා කල්ලි අතරේ මාධ්‍යයට ක්‍රියාකාරී වශයෙන් සහානුභූතිය සනින්වේදනය. සාමය සහ දේශපාලන ස්ථාවරභාවය ප්‍රවර්ධනය කළ හැක්කේ කවරාකාර වූ තත්ත්වයන් යටතේ ද?

මෙම පරිච්ඡේදය මගින් ගවේෂණය කරනු ලබන්නේ ගැටුම් නියාමනයේ දේශපාලන රාමුව සහ පුවත්පත් කලාව අතර ඇති සම්බන්ධතාව ගැනයි. දෙවනුව මාධ්‍ය පද්ධතිය තුළ තීරණාත්මක සාධක ලෙස විශේෂිත වූ දෑ දක්වයි. තුන්වෙනුව, ගැටුම් ව්‍යාවර්තනය සඳහා සහයෝගය දක්වන ජාත්‍යන්තර සහ රාජ්‍ය නොවන සංවිධාන වැනි බාහිර ක්‍රියාකරුවන්ගේ ප්‍රයත්න ඇගයීමට උත්සාහ ගනී. බල කිරීම වැනි ක්‍රමයක් ඇතුළු බාහිර මැදිහත්වීම්වල සීමාවන් පෙන්වා දෙයි. අවසාන වශයෙන් මාධ්‍යයේ විභව කාර්යභාරය පිළිබඳව නිගමනය කරා එළඹෙන අතර, ආතති සහ ගැටුම් අවස්ථාවලදී මාධ්‍ය කටයුතු කළ යුතු ආකාරය දියුණු කර ගැනීම සඳහා නිර්දේශ යෝජනා කර ඇත.



## 2. සම්මුති (සමූහ-සංගතික) ප්‍රජාතන්ත්‍රවාදය සහ 'සකාර්ය මාධ්‍ය කලාව'

මානව ඉතිහාසය පුරාම වාර්ගික ආතති සහ ගැටුම් නිරාකරණය සඳහා සාමාන්‍යයෙන් උපයෝගී කරගන්නා ක්‍රම රාශියක් පැවතුණි. මේවා අතර, අ) සමූහ ඝාතන, ආ) බලහත්කාර ජනතා හුවමාරුව, ඇ) රාජ්‍යය බෙදා වෙන් කිරීම (බෙදී ඉවත්වීම ස්වයං තීරණය) හෝ ඈ) අනුකලනය / සමීකරණය (මැක්ගැරි සහ ඕ ලියරි 1943). ජනවාර්ගික අරගලයක් සාමාන්‍යයෙන් හසුරුවනු ලබන්නේ ප්‍රධාන ක්‍රම හතරක් මාර්ගයෙනිඃ අ) අධිපතිවාදී පාලනය, ආ) තුන්වන පාර්ශවයේ මැදිහත්වීම, ඇ) කඳවුරු (කැන්ටන්) ක්‍රමය හෝ පෙඩරල් ක්‍රමය සහ ඈ) බලය හවුලේ පරිහරණය කිරීම හෝ සම්මුති ප්‍රජාතන්ත්‍රවාදයේ (සාමග්‍රිය ප්‍රජාතන්ත්‍රවාදය) ආකෘති ස්ථාපනය කිරීම.

යථාර්ථයක් වශයෙන් රට ඇතුළත හටගන්නා ගැටුම්වල ශක්තිය හීන වී ගිය කල මෙම ප්‍රවේශයන් එක්වරම සහ විවිධාකාර සංයුතිවලින් මතු වීමේ ප්‍රවණතාව ඇත. සමූහ ඝාතන සහ බලහත්කාර ජනතා හුවමාරුව සදාචාරාත්මක අංශයෙන් අනුමත කරනු නොලබයි; ජාත්‍යන්තර ප්‍රජාව විසින් ද, ප්‍රතික්ෂේප කරනු ලැබේ. බෙදී ඉවත්වීම ද සාමාන්‍යයෙන් නොපිළිගැනෙන ක්‍රියාවක් සේ සැලකේ. ප්‍රශ්නයට අදාළ රටේ ජනතාව ජන වාර්ගික වශයෙන් නානා-ජාතීය නම් පෙඩරල් ආකෘතිය බොහෝ විට දුර්වල බව ඔප්පු වී තිබේ. පෙඩරල් යුරෝපයක් පිළිබඳ මතය ඉදිරිපත් කරන අය පවා යළි

මතුවන ජාතිකත්වවාදය හමුවේ පැහැදිලි වශයෙන් ගොනු වී ඇති කණ්ඩායම් කැමැත්ත දක්වන්නේ සමූහ සංගතික ප්‍රජාතන්ත්‍රවාදයටයි. මෙය ජනවාර්ගික ගැටුම් ව්‍යාවර්තනය සඳහා වූ මාර්ගයක් වශයෙන් සැලකේ (දේශපාලන වැසියන් අතර, බලය හවුලේ පරිහරණය කිරීම)

අප ඉදිරියේ මෙසේ ක්‍රියාත්මක වන්නේ අත්හදා බැලීමක් බව අප විසින් මතක තබාගත යුතුය. සම්මුති (සමූහ සංගතික) ප්‍රජාතන්ත්‍රවාදය මගින් මූලික ජනවාර්ගික දේශපාලන ගැටුමකට සදාකාලික විසඳුමක් මීට පෙර කිසිදාක ලබාදී නැත. බටහිර යුරෝපයේ ජාතීන් ගොඩනැංවීමේ ඉතිහාසය පුරාම දේශපාලන යථාර්ථයන් සෑමවිටම තීරණය කරනු ලැබුවේ බලයේ මාර්ගයෙනි. තවදුරටත් බ්‍රිතාන්‍යය, ප්‍රංශය හෝ ස්පාඤ්ඤය වැනි ස්ථාපිත වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් පවා උතුරු අයර්ලන්තය, කෝර්සිකාව සහ බාස්ක් ප්‍රාන්තය යන ස්ථානවල ජාතිකත්ව ගැටුම් අවසන් කිරීම සඳහා ගන්නා වූ ප්‍රයත්න පැහැදිලි වශයෙන්ම අසාර්ථක වී තිබේ.

ජනවාර්ගික දේශපාලන ගැටුම් නිරාකරණය කිරීම සඳහා වූ සම්මුති ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ආකෘතිය නිර්මාණය කරන ලද අයගේ උපකල්පනය වන්නේ බහු සංස්කෘතික හෝ ජනවාර්ගික වශයෙන් බෙදී ඇති සමාජයක බලය අපයෝජනය වැළැක්වීම සඳහා වන සාමාන්‍ය ආරක්ෂාව සහතික කිරීමේ වැඩපිළිවෙල ප්‍රමාණවත් නොවන බවයි. බහුතර පාලන ප්‍රතිපත්තිය නිරන්තරයෙන්ම සිත් රඳවා ගනු ලබන අනතුරුදායක තත්ත්වය වන්නේ සුළු ජාතීන් ප්‍රතික්ෂේප කිරීම සහ ඔවුනට අවාසිදායක තත්ත්වයන් ඇති කිරීමයි. මේ හේතුව නිසා සමාජයේ සියලුම කොටස්වලට අවශ්‍ය වන්නා වූ බලතලවල කොටස් තහවුරු කිරීම සඳහා දේශපාලන ආයතන ස්ථාපිත කිරීම යෝජනා කොට ඇත. මෙහෙයුම් ප්‍රතිපත්තිය වන්නේ දේශපාලන ක්‍රමයේ සෑම තලයන්හිම අයිතීන්ගේ නියමාකාර සමතුලනයක් පවත්වාගෙන යාමයි.



රාජ්‍යයක ජනවාර්ගික කණ්ඩායම් අතර, එවැනි සමතුලනයක් පවත්වාගෙන යාම සඳහා පූර්වාවශ්‍යතාවක් විය යුත්තේ විවිධ ජනවාර්ගික කණ්ඩායම්වල නායකත්වය දරන දේශපාලන ප්‍රභූ පන්ති අතර, ඊට අනුරූපී වන්නාවූ සමගි සම්මුතියකි. බලහත්කාරයෙන් අවශෝෂණය කර ගැනීම හෝ දුර්වල ජනවාර්ගික කණ්ඩායම් වධහිංසාවට පත් කිරීම මෙන්ම වෙන්වී යාමට ප්‍රයත්න දැරීම වැනි දේ අත්හැරීම මෙම පූර්වාවශ්‍යතාවට ඇතුළත් විය යුතු වේ. ජනවාර්ගික වශයෙන් නානා ජාතීන්ට අයත් රාජ්‍යයක (සමූහ සංගතික) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සංකල්පය පහත සඳහන් මූලික කරුණු මත රඳා පවතී:

1. ජන සමූහයේ විවිධ කොටස්වල දේශපාලන ප්‍රභූ නායකයන් අතර මහා සංධානයක්;
2. අධ්‍යාපනය, මහජන වියදම් පාලනය, රැකියා ප්‍රතිපත්තිය සහ පොදු සේවා විකාශය යන වැදගත් වූ ක්ෂේත්‍රයන්හි සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා එයට අනුරූපී වූ පූර්වෝපාය ක්‍රියා පිළිවෙලක් සහිත සමානුපාතික නියෝජන ක්‍රමයක්;
3. ව්‍යවස්ථාවට ඇතුළත් බලය හවුලේ භුක්ති විඳින සෑමට නිෂේධ බලය පාවිච්චි කිරීමේ අයිතිය;
4. රාජ්‍යයට සම්බන්ධ වී සිටින සියලුම ජනවාර්ගික කොටස් සඳහා ස්ථාපිත අභ්‍යන්තර ස්වාධිපත්‍යය (ස්වයං තීරණය).

මෙවැනි සමූහ සංගතික ප්‍රජාතන්ත්‍රවාදයක් නිසැකයෙන්ම පරමාදර්ශී වන්නේය. එසේ වන්නේ එය ජාතික බල කේන්ද්‍රීය අංශයෙන් ඒකපාර්ශ්වික වාසි බලාපොරොත්තු වන දේශපාලන

ක්‍රමය අවබෝධයකින් යුක්තව අත්හැර දැමීම පූර්ව කොන්දේසියක් වශයෙන් සැලකීමට අදහස් කරන බැවිනි. ඒ හේතුකොට ගෙන සමූහ සංගතික ප්‍රජාතන්ත්‍රවාදය දෙස බැලිය යුත්තේ තථ්‍ය ලෙස, පූර්ණ වශයෙන් ලබාගත හැකි තත්ත්වයක් ලෙස නොව එයට විකල්පයක් වශයෙන් වූ අරමුණක් හෝ ප්‍රාර්ථනාවක් ලෙසය. කෙසේ වුවද, යමෙකුට පිළිගත හැකි දෙයක් වන්නේ එවැනි ආකෘතියකට පදනම් වූ ගැටුම් නිරාකරණ ක්‍රියාවලියක් පවා දැනටමත් සාමකාමී ගැටුම් නිරාකරණයේ වැදගත් මූලික අංශයක් ඒකාබද්ධ කොටගෙන තිබීමයි. ඒ හා ප්‍රමාණයටම ඒකපාර්ශ්වීය පරමාර්ථ සහ ඒවායින් ඇතිවන ප්‍රයෝජන බලපෑම්වලින් හෝ බලහත්කාරයෙන් ලබාගැනීම ආරම්භයේ පටන්ම ඉවත් වී යයි.

පරමාදර්ශී ලෝකයක මාධ්‍ය මගින් ගැටුම් උත්සන්න කිරීමට තුඩු දෙන්නා වූ අගතිගාමී තත්ත්වයන් තිව්‍ර කරනවා වෙනුවට අවම වශයෙන් සාමය නිර්මාණය වීමට මංපාදන ආකාරයට තම වාර්තාකරණ ශෛලීය හැඩගැස්සීමට උත්සාහ කළ යුතුය. එවැනි මාධ්‍යමාලාවක් සම්මුති ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයේ තීරණාත්මක කොටසක් වන්නේය. එමෙන්ම ගැටුම් වැළැක්වීමේ දී හා නිරාකරණය කිරීමේ දී මාධ්‍යයේ නිරවද්‍ය කාර්යභාරය නියෝජනය කරයි. මෙය එසේ වුවත්, බොහෝ විට දැකිය හැක්කේ මාධ්‍ය විසින් ගැටුම් වාර්තා කිරීමේ දී අසුභවාදී අංශවලට ප්‍රමුඛත්වය දීමයි. මෙය ඔවුන් දැන දැනම කරන බවට සැක මතු වේ. හේතුව එය 'වැඩියෙන් අලෙවි' වන නිසාය. ගැටුම් වැළැක්වීම සම්බන්ධයෙන් වඩාත් ධනාත්මක කාර්යභාරයක් අනුගමනය කිරීමේ වගකීම් බොහෝ විට මාධ්‍යවලට පැවරේ. ඒ අතරම පළපුරුදු මාධ්‍යවේදීන්ට නිරන්තරයෙන්ම එල්ල වන චෝදනාවක් වන්නේ ඔවුන් සහජයෙන්ම සංශයවාදීන් බවයි. එසේ වුවද, සිවිල් සමාජවල සාමය සහ සංවර්ධන ක්‍රියාකාරීත්ව ප්‍රවර්ධනය කිරීම සඳහා සාමුහිකව බැඳී සිටීමේ හැඟීමක් ඇති ජන කොට්ඨාසයක් හැටියට මාධ්‍ය ක්‍රියා කරනු ඇතැයි යන්න අතිශය සරල බලාපොරොත්තුවකි.

ජාත්‍යන්තර රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම වෙනත් ආයතන ද වරින් වර නිකුත් කර ඇති නිවේදනවලින් ප්‍රකාශ කර ඇති මතය වන්නේ ගැටුම් පිළිබඳව ධනාත්මකව වාර්තා කරමින් සහ වෛරය ප්‍රචාරය කර හැරීමට එරෙහිව සටන් වැදීමෙන් වැදගත් කාර්යභාරයක් ඉටුකරගත හැකි බවයි. උදාහරණයක් වශයෙන් ගැටුම් වැළැක්වීම පිළිබඳ යුරෝපීය සම්මේලනයේ (ඇම්ස්ටර්ඩෑම්, 27-28 පෙබරවාරි 1997) සමාප්ති ප්‍රකාශය අනුව යුරෝපා සංගමයෙන් ඉල්ලා සිටින ලද්දේ ගැටුම්වලට නැඹුරු වී තිබෙන සමාජ තුළ නිදහස් ප්‍රාදේශීය මාධ්‍ය වාර්තා කිරීමේ ප්‍රයත්නයන්ට සහයෝගය දැක්විය යුත්තේ කුමන ආකාරයකට ද යන්නයි. එයට අතිරේකව ගැටුම් පවතින ප්‍රදේශවල සේවය කරන ප්‍රාදේශීය සහ යුරෝපීය මාධ්‍යකරුවන්ට විශේෂ අධ්‍යාපනයක් යෝජනා කරන ලදී. ගැටුම් වැළැක්වීම කෙරෙහි කාලය සහ ශ්‍රමය ආයෝජනය කිරීමෙහි අවශ්‍යතාව ගැන බලයේ සිටින දේශපාලනඥයන්ට සහ පොදු ජනතාවට අවබෝධයක් ලබාදීමට මාධ්‍යකරුවන්ගෙන් බලවත් සේ ඉල්ලා සිටිනවා ඇත. ගැටුම් කළමනාකරණය සඳහා වන සැලකිය යුතු මානුෂීය සහ භාණ්ඩ පිරිවැය ගැන අවධානය යොමු කිරීමෙන් මෙය ආරම්භ කළ හැකි බව යෝජනා කරන ලදී.

මාධ්‍යයට ගැටුම් සමනය කිරීමට අධාර විය හැකිවා පමණක් නොව විවිධ සම්භවයන් ඇති මිනිසුන් අතර, සහජීවනය සහ සහයෝගය පවත්වාගෙන යාමට දිරිදීම සඳහා ඔවුන් සුවිශේෂ ලෙස ස්ථානගත වී ඇති බවට මාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සංගමයට (IFJ) ට ඒත්තු ගොස්ව තිබේ. "

ඒකාකාරී බවින් සහ ඇවිස්සීමෙන් බැහැර වූ විෂය නිශ්‍රිත සහ සත්‍ය පදනම් කරගත් වාර්තාකරණයේ නිරත වීමෙන් මාධ්‍යවේදීන්ට පුද්ගලිකවත් පොදුවේ මාධ්‍යයටත් අවබෝධය සහ එකිනෙකා සම්බන්ධ කිරීම සඳහා දායකවීමට අතිශය ප්‍රබල හැකියාවක් තිබේ" යනුවෙන් ජාත්‍යන්තර මාධ්‍යවේදීන්ගේ සංගමය (IFJ) ගෙන ඇති මෙම මතය ඔවුන්ගේ අත්පොතක මේ විෂය පිළිබඳව සඳහන් කිරීමේදී සටහන් කර ඇත (IFJ 1997). අප්‍රිකාවේ ජනවාර්ගික ගැටුම් වාර්තා කිරීම ගැන පැවැති විවාදයක අතරවාරයේ දී මෙම සංවිධානය එවැනි සිද්ධීන් මාධ්‍ය මගින් වාර්තා කරන විට වඩාත් තුලනාත්මකව සහ විෂය නිශ්‍රිතව ක්‍රියාකිරීම සඳහා සවිස්තරාත්මක සහ ප්‍රායෝගික නිර්දේශ කෙටුම්පත් කර ඇත. සාධනීය සහ සංවර්ධනයට නැඹුරු වූ මාධ්‍ය කලාවක නිශ්චිත ස්වභාවය කුමන ස්වරූපයක් ගත යුතුදැයි ජාත්‍යන්තර වේදිකාවේ සිටින වැදගත් ක්‍රියාකාරීන් ඉදිරිපත් කරනු ලබන විදග්ධ යෝජනාවල අඩුවක් නොමැත. සම්භාවනීය 'ඩබ්ලියු' අකුරු පහ වන (why - ඇයි, what - මොකද්ද, who-- කවුද, where - කොහිද සහ when - කවදාද) යන කරුණු පුවත් ඛණ්ඩවලින් ආවරණය කළ යුතුය. එයට අමතරව ඇමෙරිකා එක්සත් ජනපදය 'එස්' (සොලියුෂන්) විසඳුම සහ 'සී' කොමන් ග්‍රවුන්ඩ්) පොදු ස්ථාවරය ද ඇතුළත් කරන මෙන් දන්වා සිටී.

මාධ්‍යවේදීන්ගේ භූමිකාවට ඇතුළත් උතුම් අපේක්ෂා වෙයි. මේ අතරට ගැටුම් වාර්තා කරන්නන් ගැටුම් නිරාකරණ ක්‍රමෝපායයන් ගැන පුහුණුවක් ලැබීමත් සාමය ප්‍රවර්ධනයට කැපවූවන් ලෙස නිකැළැල් කීර්තිනාමයක් ලබා සිටීමත් අවශ්‍ය යැයි යෝජනා වී ඇත. ඔවුන් විසින් භීෂණය වපුරන්නන්ගේ මතවලට උපස්ථම්භක වන වන දේ නොව ගැටුමට අසුව පීඩා විඳින්නන්ගේ දුක් තැවුල් කතන්දර ඉදිරිපත් කරමින් මහජනතාව ප්‍රබුද්ධයන් කිරීමට ඉවහල් වන දේය.



අනාගතයේ ඇතිවන ගැටුම් නිරාකරණ සහ යුද්ධ වැළැක්වීම සඳහා පවා ඇති මාර්ගය වන්නේ මාධ්‍යවේදය විය හැකි යයි යෝජනා වී ඇත. එසේම මෙම අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා හිතකාමී යෝජනා ද මාධ්‍යවේදීන් වෙත සපයා ඇත. ජොහාන් ගල්තුං (1997) යෝජනා කර ඇති පරිදි මාධ්‍යවේදීන්:

- සිද්ධිය සෑම අංශයකින් ම සපුරා විස්තර කළ යුතුය;
- විවිධ මූලාශ්‍රවලින් තොරතුරු ලබාගැන්මට උනන්දු විය යුතුය;
- ඉහළ පැලැන්තියේ අය මූලාශ්‍ර වශයෙන් අවශ්‍ය ප්‍රමාණයට වඩා යොදාගැනීම සීමා කළ යුතු නමුත් විවිධ විශේෂඥයන් ප්‍රයෝජනයට ගත යුතුය;
- යුද්ධයේ තාක්ෂණ විද්‍යා අංශය හුවා දැක්වීමෙන් වැළැකිය යුතුය;
- යුද්ධයේ බිහිසුණු බව විචිත්‍රව පෙන්වාදීම සඳහා නාට්‍යමය චිත්ත රූප ද පාවිච්චි කළ යුතුය;
- සාමාන්‍ය මිනිසුන් පිළිබඳව බුද්ධිගෝචර හා මනාව ලියන ලද වාර්තා සැපයිය යුතුය;
- පසුබිම් වාර්තා වැඩිපුර සැපයිය යුතුය;
- දේශපාලන පුවත් මවන්නන් (කටකතා මවන්නන්) ජනමාධ්‍යවේදීන් තමන්ගේ වාසියට යොදාගැනීමට මාන බලන බැවින් ඔවුන් ප්‍රවේශම් විය යුතුය.

- ඔවුන්ගේ වැඩකටයුතු පමණක්ම කතාවක් වශයෙන් සැලකීමෙන් වැළකිය යුතුය.
- සාම ප්‍රයත්නයන්ට පුළුල් ප්‍රචාරයක් ලබාදී ඒවා ප්‍රවර්ධනය කළ යුතුය.

**කොටුව 1: සාම මාධ්‍ය කලාවක් සඳහා වූ යෝජනා**

ඇනබල් මැක් ගෝල්ඩ්රික් සහ ජේක් ලින්ච් (බ්‍රිතාන්‍ය පුවත් මාධ්‍ය ජාලයේ ස්කයි නිව්ස් සහ ද ඉන්ඩිපෙන්ඩන්ට් වාර්තාකරු) යන අය ගැටුම් ආවරණය කිරීම සඳහා වඩාත් දියුණු කරන ලද නියමයන් කට්ටලයක් පිළියෙල කර ඇත. වෙනත් දේවලට අතිරේක වශයෙන් පහත සඳහන් ක්‍රමෝපායයන් ද ඇතුළත් කර ඇත.

1. ගැටුමක් යනු එක් අරමුණක් සඳහා තරග කරන පාර්ශ්ව දෙකකින් පමණක් සමන්විත දෙයක් වශයෙන් මවා පෙන්වීමෙන් **වළකින්න.** එවන් තත්ත්වයකදී තර්කානුකූල ප්‍රතිඵලය වන්නේ එක් අයෙකු ජයග්‍රහණය කොට අනිකා පරාජයට පත්වීමයි. ඒ වෙනුවට සාම මාධ්‍යවේදියා විසින් කළ යුත්තේ පාර්ශ්ව දෙක අරමුණු රාශියක් හඹා යන කුඩා කණ්ඩායම් කීපයක් වන පරිදි **විසිර වීමයි.** මේ හේතුකොට ගෙන ප්‍රතිඵල රාශියක් අත්පත් කරදීම සඳහා වඩාත් නිර්මාණාත්මක හැකියාවන් විවෘත කරදීමයි.

2. තමා යන අනික් පාර්ශවය අතර, පැහැදිලි වෙනස්කම් ඉස්මතු කිරීමෙන් **වළකින්න.** මේවා බොහෝ විට යොදාගනු ලබන්නේ අනෙක් පාර්ශ්වය තර්ජනයක් බවත් නැතිනම් සම්මත ශිෂ්ට සම්පන්න හැසිරීමෙන් ඔබ්බට ගොස් ඇත යන හැඟීම ඒත්තු ගැන්වීමටය. මේ අවස්ථා දෙකම ප්‍රචණ්ඩත්වය යුක්තිසහගත කිරීම සඳහා යොදාගත හැකි ප්‍රධාන කරුණුය. **ඒ වෙනුවට** අනෙක් පාර්ශවය තමා තුළම සිටීදැයි බලන්න. ප්‍රතිලෝම වශයෙන් ද එය කරන්න.

3. කිසියම් ගැටුමක් එය සිදුවන ස්ථානයේ පමණක් හෝ ප්‍රචණ්ඩත්වය පවතින කාලය තුළ පමණක් සිදුවන දෙයක් සේ සැලකීමෙන් **වළකින්න. ඒ වෙනුවට** අනිකුත් ස්ථානවල ජනතාවට මේ අවස්ථාවේ දී හා මතුව ඇතිවිය හැකි ප්‍රතිඵල සහ සම්බන්ධකම් සොයාගැනීමට උත්සාහ ගන්න.

4. පාර්ශවයන් වෙන් කරනු ලබන්නේ කුමකින්ද සහ ඔවුන්ට අවශ්‍ය යයි ඔවුන් කියන දේ අතර වෙනස්කම් ගැන වැඩිදුර සිත යෙදවීමෙන් **වළකින්න. ඒ වෙනුවට** පොදු ස්ථාවරයක පිහිටි විෂය පථ අනාවරණය කර ගැනීමට ප්‍රයෝජනවත් විය හැකි ප්‍රශ්න ඇසීමට උත්සාහ කරන්න. සමහර අරමුණු සියල්ටලන් පසු පොදුවේ පරිහරණය කර ගැනීමට හෝ අවම වශයෙන් ගැලපෙන බව හඟවන පිළිතුරුවලට පුළුල් තැනක් දෙමින් ඔබගේ වාර්තාව ඉදිරිපත් කරන්න.

5. ප්‍රචණ්ඩ ක්‍රියා පමණක් වාර්තා කිරීමෙන් සහ හිංෂණය සවිස්තරාත්මකව ඉදිරිපත් කිරීමෙන් **වළකින්න.** ඔබ අනිත් සියල්ල බැහැර කළහොත් ප්‍රචණ්ඩත්වයට

415

හේතුව වශයෙන් කළ හැකි එකම පැහැදිලි කිරීම වන්නේ පෙරදී සිදු වූ ප්‍රචණ්ඩත්වය (පළිගැනීම) බවට කරන ප්‍රකාශන යයි එකම පිළියම වැඩිපුර ප්‍රචණ්ඩවීමයි (බලහත්කාරකම/ දඬුවම). ඒ **වෙනුවට** ප්‍රචණ්ඩත්වය පැහැදිලි කරදීමේ ක්‍රමයක් වශයෙන් ජනතාව හිරකොට තබා ගැනීම සහ ඉච්ඡා භංත්වයට පත් කිරීම හෝ එදිනෙදා ජීවිතය තුළ දී ඌනතාවලින් ගහණ තත්ත්වයකට පත් කිරීම ආදිය පෙන්වා දෙන්න.

6. එය ආරම්භ කිරීම ගැන තවත් කෙනෙකුට වරද පැවරීමෙන් **වළකින්න.** ඒ වෙනුවට ප්‍රශ්න සහ මතභේදයට තුඩු දී ඇති කරුණුවල වගකීම බෙදාගත් විට එයින් අත්වන ප්‍රතිඵල වන්නේ සියලු පාර්ශ්වයන් එය හිතාමතා කළ දෙයක් නොවන බව පැවසීමයි.

7. එක් පාර්ශවයක් පමණක් අත්විඳින දුක් හිරිහැර බිය සහ දුක් ගැනවිලි සුවිශේෂ වශයෙන් කේන්ද්‍රගත කිරීමෙන් **වළකින්න.** මෙය පාර්ශ්වයන් දුෂ්ටයන් සහ අපරාධයට ලක් වූවන් වශයෙන් කොටස් දෙකකට බෙදනු ලබයි. මෙයින් හඟවන්නේ දුෂ්ටයන්ට බල කිරීම හෝ ඔවුනට දඬුවම් දීම විසඳුමක් බවට තහවුරු වීමයි. ඒ වෙනුවට සෑම පාර්ශ්වයකම දුක් කරදර, බිය හා දුක් ගැනවිලි එක හා සමානව ප්‍රවෘත්තිමය වටිනාකමක් ඇති සේ සලකන්න.



8. අනාථ වූ, මහත් විනාශයට ලක් වූ 'දයා පරවශ', 'අසරණ', 'දුක්ඛදායක', 'ඛේදවාචකය' වැනි පීඩාකාරී භාෂාවක් පාවිච්චි කිරීමෙන් **වළකින්න.** එයින් කියැවෙන්නේ මිනිසුන් කණ්ඩායමකට කර ඇති හෝ කළ හැකි දේ පමණි. මෙය ඔවුන් බල රහිත කොට වෙනස්වීමකට ඇති විකල්ප සීමා කරවයි. **ඒ වෙනුවට** ජනතාව විසින් **කර** ඇති දේ සහ කළ හැකි දේ ගැන වාර්තා කරන්න. ඔවුන්ගේ සැපදුක් පමණක් නොවිමසන්න. ඔවුන් ප්‍රශ්නවලට මුහුණ දෙන්නේ කෙසේද? ඔවුන්ට කිසියම් වූ විසඳුම් යෝජනා කළ හැකිදැයි විමසන්න.

9. ජනතාවට සිදු වූ දේ විස්තර කිරීමට අවිනිශ්චිත වූ හැඟීම් අවුස්සන වචන පාවිච්චි කිරීමෙන් **වළකින්න.**

- 'සමූහ ඝාතන යනු මුළු මහත් ජනතාවක් සම්පූර්ණයෙන්ම අතුගා දැමීමයි.
- සංහාරය යනු නිරායුධ සහ ආරක්ෂාවකින් තොර බවට හඳුනාගන්නා ලද ජනතාවක් හිතාමතාම මරා දැමීමයි. මෙය අපට සහතික විය හැකි ද? මොවුන් සටනේදී මිය ගියවුන් නොවිය හැකිද?
- 'ක්‍රමානුකූල' යනු නිදසුන් වශයෙන් දූෂණය කිරීම හෝ ජනතාව ඔවුන්ගේ නිවාසවලින් බලහත්කාරයෙන් එළවා දැමීම ආදියයි. එවැන්නක් හිතාමතාම සැලසුමකට අනුව ඇත්ත වශයෙන්ම සංවිධානය කරන ලද්දේ ද? නැතිනම් එය එකිනෙකට සම්බන්ධකමක් නොමැති, එතෙකුදු වුවත් අතිශය හානිකර සිදුවීම් ගණනාවක් ද?

ඒ වෙනුවට අප දන්නා දේ ගැන නිතරම නිශ්චිත විය යුතුය. දුක් කරදර අවම කොට දැක්විය යුතු නැත. නමුත් අති ප්‍රහාරාත්මක භාෂාව අතිශය බරපතළ අවස්ථා සඳහා වෙන්කර තබාගන්න. නැතිනම් ඔබ භාෂාව අතික්‍රමණය තත්ත්වයකට පත්කොට ප්‍රචණ්ඩත්වය වැඩි කොට සමානුපාතික නොවන ප්‍රතිචාරයන් යුක්ති සහගත කිරීමට උදව් කරනවා ඇත. **ඒ වෙනුවට** දන්නා දේ ගැන නිශ්චිත වන්න. දුක් වේදනා අවම කෙරෙතත්, ප්‍රබලතම භාෂාව අති භයානක අවස්ථා සඳහා තබාගන්න; එසේ නැතහොත් ඔබ භාෂාව බෙලහීන කොට, අනනුරූප ප්‍රතිචාර දැක්වීමෙන් භීෂණය උත්සන්න නොකරන්න.

10. පරමාර්ථයන්ට භයංකාර ස්වරූප ලබාදීමෙන් **වැළකිය යුතුය.** උදාහරණ වශයෙන් දුෂ්ට, කුරිරු, සාහසික සහ ම්ලේච්ඡ යන විශේෂණ දැක්විය හැකිය. මේ පද නිරන්තරයෙන්ම විස්තර කරන්නේ එක් පාර්ශ්වයක මතය වන අතර අනෙක් පාර්ශ්වය කර ඇති දේය. ඒවා භාවිත කිරීමෙන් මාධ්‍යකරු එම පැත්තට වැටී ප්‍රචණ්ඩත්වය උග්‍ර තත්ත්වයකට පත්වීමට හා සාධාරණීකරණය කිරීමට උපකාරී වෙයි. **ඒ වෙනුවට** කර ඇති වැරැදි ක්‍රියාව ගැන ඔබ දන්නා බව වාර්තා කරන්න. එම සිද්ධිය ගැන අනික් අයගේ වාර්තා හෝ විස්තරවල විශ්වසනීයත්වය පිළිබඳව ඔබට හැකි පමණ තොරතුරු සපයන්න.

11. 'ත්‍රස්තවාදියා', 'අන්තවාදියා', 'අන්ධ භක්තිකයා' සහ 'මූලධර්මවාදියා' යන පද වැනි භයංකර නම් පටබැඳීමෙන් **වැළකිය යුතුය.** මේවා නිරන්තරයෙන්ම ඔවුන්ට ලබා දෙන්නේ අප විසිනි. තමන් ගැන විස්තර කිරීමට කිසිවෙකුත් මේවා පාවිච්චි කරන්නේ නැත. එබැවින් මාධ්‍යකරුවෙකු මේවා පාවිච්චි කිරීමෙන් අදහස් වන්නේ පැති තෝරාගැනීමකි. පුද්ගලයා අයුක්ති සහගත බව ඉන් ගම්‍ය වන බැවින් ඔවුන්ට කරුණු තේරුම් කරදීමට යාම (සාකච්ඡා කිරීම) ඊටත් වඩා තේරුමක් නොමැති දෙයක් වනු ඇත. **ඒ වෙනුවට** මිනිසුන් තමන් හඳුනාගන්නා නම්වලින් ආමන්ත්‍රණය කිරීමට උත්සාහ ගන්න. නැතිනම් ඔබ ඔවුන් ගැන විස්තර කිරීමේ දී වඩාත් නිශ්චිත වන්න.

12. එක් පාර්ශ්වයක පමණක් මානව හිමිකම් අපයෝජන, අයුතු ක්‍රියා සහ වැරදි ලෙස හැසිරීම් ගැන විශේෂිත වශයෙන් කේන්ද්‍රීය ගත කිරීමෙන් **වළකින්න. ඒ වෙනුවට** සියලුම වැරදි ලෙස හැසිරෙන අය නම් කිරීමට උත්සාහ ගන්න. ගැටුමට සම්බන්ධ **සියලු** පාර්ශ්ව මගින් කරන ලද චෝදනා ගැන සමානත්වයෙන් සලකන්න.

13. මතයක් හෝ අවධාරණයෙන් කියාපෑමක් තහවුරු කරන ලද කරුණක් සේ පෙන්වා දීමෙන් **වළකින්න** (උදාහරණයක් වශයෙන්, 'නැගෙනහිර ටිමෝරයේ සංහාරයකට ඉටුරිකෝ ගුටේරේස් වගකිව යුතු යයි' කියැවේ) **ඒ වෙනුවට** කීවේ කුමක්ද? කවුරුන් විසින් ද යන වග ඔබගේ පාඨකයන්ට හෝ ශ්‍රාවකයන්ට මෙසේ පවසන්න

("නැගෙනහිර ටිමෝරයේ සංහාරයකට ගුටේරේස් නියෝග කළ බවට එක්සත් ජාතීන්ගේ උසස් නිලධාරියෙකු විසින් චෝදනා කරනු ලබයි"). ඒ ආකාරයෙන් ගැටුමේ එක් පාර්ශවයක් අනෙක් පාර්ශවයට එරෙහිව කෙරෙන චෝදනා පිළිබඳ වගකීමෙන් ඔබත් ඔබගේ ප්‍රවෘත්ති සේවයක් වැළකෙයි.

14. මිලිටරි ජයග්‍රහණ හෝ සටන් විරාමවලට හේතුවන ලියකියවිලි අත්සන් කිරීම් අවශ්‍යයෙන්ම සාමය නිර්මාණය කරන ලද සිද්ධීන් හැටියට සැලකීමෙන් **වළකින්න. ඒ වෙනුවට** අනාගතයේදී ජනතාව තවදුරටත් ප්‍රචණ්ඩ ක්‍රියාවලට යොමු කළ හැකි, දූනට ඉතිරි වී තිබෙන ප්‍රශ්න ගැන වාර්තා කිරීමට උත්සාහ ගන්න.

15. අප පාර්ශවයේ නායකයන් විසඳුම් යෝජනා කරන තෙක් හෝ ලබා දෙන තෙක් බලාසිටීමෙන් **වළකින්න. ඒ වෙනුවට** සාම පියවර පරික්ෂාකාරීව තෝරාගෙන සෝදිසියක් කර බලන්න. ඇමතිවරුන් ඉලක්ක කරගත් ප්‍රශ්න අසන්න; උදාහරණයක් වශයෙන් බිම් මට්ටමේ සංවිධානලින් ඉදිරිපත් කරන ලද අදහස් ගැන විමසන්න. පාර්ශ්වයන් ඇත්ත වශයෙන්ම ඉස්මතු කිරීමට බලාපොරොත්තු වන පාදක කරුණු ගැන ඔබ දන්නා දේ සමග සංසන්දනාත්මකව සාමයේ සාපේක්ෂ වැදගත්කම තක්සේරු කරන්න. ඒවා ස්ථාපිත තත්ත්වයන් සමග නොගැලපෙන බැවින් සරල අන්දමින් නොසලකා හැරීම නොකළ යුතුය.

**- මැක් ගොල්ඩ්වරික් සහ ලින්ච් 2000**



ගැටුම් අවස්ථාවලදී යහපත් මාධ්‍ය කලාවක් සඳහා වූ මෙම නිර්දේශයන් සමාලෝචනයට භාජනය කිරීමේ දී වැරදි උපකල්පනයකට ගොදුරු වීම ඉතා පහසුය. එම උපකල්පනයට අනුව අවශ්‍ය එකම දේ වන්නේ පැහැදිලිව හා පූර්ව නිගමනයකින් තොරව වාර්තා කිරීම සහ පාඨකයන්, ශ්‍රාවකයන්, ප්‍රේක්ෂකයන් සැබෑ ප්‍රශ්න පිළිබඳව දැනුවත් කරන ආකාරයේ ගවේෂණාත්මක ප්‍රශ්න මතු කළ යුතු බවය. එයින් තවදුරටත් හැඟී යන්නේ ඔවුන්ගේ සහෘද ජනතාව ඒ හේතු කොට ගෙනම 'සැබෑ පිරිවැය' වටහා ගැනීමට පටන් ගෙන තම මත ගැලපෙන පරිදි නැවත තක්සේරු කරගන්නා බවය. ඒ හා සමාන ප්‍රවණතාවකට අනුව බොහෝ විචාරකයන් සරලව විශ්වාස කරනු ලබන්නේ නවතාවයකින් යුත් සහ වඩාත් උසස් අන්තර්ජාල වැනි ශිල්ප ක්‍රම ගැටුම් මැඩ පැවැත්වීමේ වඩාත් සාමකාමී උපක්‍රමයක් නිරායාසයෙන්ම උත්පාදනය වන බවයි. මෙයට හොඳ උදාහරණයක් වන්නේ වර්මොන්ට් විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ ගුරුවරයෙකු සහ ගැටුම් ව්‍යාවර්තනය පිළිබඳ විශේෂඥයෙකු වූ ජේ මුවර්ගේ මතයයි. යුද්ධය හා සාමය පිළිබඳ වාර්තා කිරීම පිළිබඳ විවාදයේදී ඔහු ඉදිරිපත් කළ කරුණුවලදී තම වැටහීම (www.mediachannel.org) ප්‍රකාශ කළේය. ඒ අනුව අන්තර්ජාල යුගයේදී ගැටුම් සහ යුද්ධ ගැන වාර්තා කිරීම කිසි දිනෙක පෙර මෙන් නොවනු ඇත. මෙම ප්‍රතිඵලය අත්වූයේ පුද්ගලයන්ට දුන් දුර බැහැර සිට කෙළින්ම සහ යුද පෙරමුණු හරහා සම්බන්ධතා ඇති කර ගැනීමට හැකි වී තිබීමෙනි. මෙය වඩාත් පැහැදිලිව විද්‍යමාන වූයේ 1999 දී සර්බියාවට එල්ල වෙමින් තිබූ නේටෝ ප්‍රහාරය පිළිබඳ කාරණයේ දී ය.

එසේ වුවත් මුවර් අවවාදාත්මක ව පෙන්වා දෙන්නේ අන්තර්ජාලය කිසිම අයුරකින්වත් ජනතාව අතරට යාම සඳහා භාවිත කරනු ලබන වඩාත් සම්ප්‍රදායික හා පිළිගත් ක්‍රම වන පත්‍රිකා, නිසල සහාය පළ කිරීම්, සත්‍යග්‍රහ සහ වෙනත් ක්‍රියාවෙන් කරනු ලබන ප්‍රචාරණ, එනම් සාම කණ්ඩායම් සහ වෙන රාජ්‍ය නොවන සංවිධාන උපයෝගී කර ගන්නා ක්‍රියාකාරී වැඩපිළිවෙලක් කිසිවිටෙකත් සංදේශකයක් නොවන බවයි. ඔහු පෙන්වා දෙන්නේ සංවිධාන කටයුතු සඳහා ප්‍රයෝජනයට ගන්නා අන්තර්ජාලයේ භාවිතයට උපකාරීවන මිල අධික දෘඩාංග සහ විදුලි සංදේශ පහසුකම්වලට ප්‍රවේශ වීමේ හැකියාව ජාති, පංති මෙන්ම කිසියම් ප්‍රමාණයකට ලිංග වශයෙන් ද අසමමිතික සේ සැලකෙන බවයි. අන්තර්ජාලය යනු විවිධ පුද්ගලයන් සම්බන්ධ කරගන්නා දෙයක් වන නමුත් උනන්දු සහ අනන්‍යතා කණ්ඩායම් වශයෙන් බොහෝ අතුරු බෙදීම්වලට භාජනය වී ඇත. එම කණ්ඩායම් එකිනෙකා සමග සන්නිවේදනයක් පවත්වාගෙන යාම සමහරවිට සිදුවිය හැකි අතර, සමහරවිට සිදු නොවන්නට ද ඉඩ තිබේ. සන්නිවේදනය ගැන උනන්දුවක් දක්වන අය සම්බන්ධ කිරීමට එය වඩාත් හොඳ මෙවලමක් විය හැකි අතර, පැහැදීමක් නොමැති අය අතරට යාමේදී ඵලදායී නොවනු ඇත.

අන්තර්ජාලය සහ වෙනත් නව ශිල්ප ක්‍රම මගින් ගැටුම් සහ යුද්ධ ගැන ලෝකය පුරා තිබෙන මත හා විරෝධතා වෙනස් කිරීමට කටයුතු කරන්නේ කෙසේද යන්න ගැන විවාදයකට එළැඹීමට ප්‍රථම අප විසින් ඉදිරිපත් කළ යුතු ප්‍රශ්නය වන්නේ මේ තාක් ඉදිරිපත් කරන ලද සරල හා නිහතමානී අදහස් අසාර්ථක වූයේ කෙසේද යන්නයි. ගැටුම් වැළැක්වීම සහ නිරාකරණය සඳහා මාධ්‍යයෙන් කළ හැකි දායකත්වය කොතරම් විය හැකිද යන්න ගැන කෙරෙන ඕනෑම යථාර්ථවාදී ඇගැයීමක් ම පදනම් විය යුත්තේ අදාළ රටට ආවේණික වූ මාධ්‍ය සංවර්ධනය සඳහා වන සාමාන්‍ය දේශපාලන, ආර්ථික සහ සමාජ ව්‍යූහයයක විශ්ලේෂණයක් මතය. එම මාධ්‍යයේ හුදු සාමාජිකයින් සම්බන්ධ විශේෂිත අවස්ථා අපට නියමාකාරව පරීක්ෂා කර බැලිය හැක්කේ එවිට පමණි. පහත සඳහන් ඡේද එවැනි විශ්ලේෂණාත්මක ව්‍යූහයක මූලික කරුණු සංක්ෂේපයෙන් දක්වයි.



## 3. මාධ්‍ය පද්ධතිය තුළ නිශ්චායක සාධක

ගැටුම් වැළැක්වීමේදී හා නිරාකරණය කිරීමේ දී සහ සාමය ආරක්ෂා කිරීමේ දී මාධ්‍යයේ කාර්යභාරය අපට ඉතා හොඳින් තක්සේරු කළ හැක්කේ අප එම කාර්යභාරය අවශ්‍යයෙන්ම සමස්ත සමාජ තත්ත්වයන්ගේ සංරචකයක් සහ ප්‍රකාශනයක් සේ දැකීම මතය. මාධ්‍ය මත බලපාන වැදගත් බලපෑම් විස්තර කරනු ලබන ඕනෑම ව්‍යූහයක් ඒ හේතුකොට ගෙන මූලික විෂය පථ හතරක් හුවා දැක්විය යුතු වේ:

- ***දේශපාලන සන්දර්භය:*** නීතියේ ආධිපත්‍යයට එරෙහි ඒකාධිපති අධිකාරය;
- ***ආර්ථික තත්ත්වයන්:*** මාධ්‍යය ස්වාධීන ආර්ථික සංවිධානයක් වශයෙන් හෝ ආණ්ඩුවේ පාලනයට යටත් එකක් වශයෙන් (මාධ්‍යය රාජ්‍ය ව්‍යූහයේ මෙවලමක් වශයෙන්);
- ***මාධ්‍ය කලාවේ ගුණාත්මක භාවය:*** විවේචනාත්මක සහ විශ්ලේෂනාත්මක වාර්තා කිරීම් හෝ 'වෛරයේ භාෂාව' පාවිච්චි කරමින් 'බල කේන්ද්‍රයේ ලඝු ලේඛක තත්ත්වයට' සීමා වී කටයුතු කිරීම;
- ***මහජන ආකල්ප:*** ප්‍රබුද්ධ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායයන් හෝ ආධිපත්‍යයික ඇගැයීම් පද්ධති.

මෙම ආදර්ශය යටතේ මාධ්‍ය දෛශිකයන් (vector) සේ පෙනේ. යා යුතු දිශාව තීරණය වන්නේ ඉහත සඳහන් කොටස් හතරේම කේවල වූ බලපෑම මතයි. එක් සාධකයක දුර්වලතාවක් අනිකේ ශක්තියෙන් අර්ධ වශයෙන් පමණක් ඌනපූරණ කරගත හැකිය. කෙටියෙන් පවසන්නේ නම් අනෙක් සංරචක නොමැති කල හෝ අක්‍රිය වූ කල කිසිම සංරචකයකට තම පූර්ණ ශක්තිය යෙදවිය නොහැකිය.

විවිධ තත්ත්වයන් යටතේ සංරචක අතරේ තිබෙන අන්තර් සම්බන්ධතා ගවේෂණය කිරීමට විශ්ලේෂණාත්මක ව්‍යූහය ඉඩකඩ ලබා දෙයි. උදාහරණයක් වශයෙන් දීර්ඝ කාලීන ව වාර්තාකරණයේ දී උසස් ප්‍රමිතීන් ප්‍රගුණ කරවීමට මාධ්‍යකරණ පුහුණු හොඳම ආරම්භක ස්ථානය බව අවබෝධ කරගන්නේ නම් මේ අංශයෙන් ගනු ලබන සෑම ප්‍රයත්නයක්ම අවාසනාවකට මෙන් අසාර්ථක වී ඇති බව වටහාගත යුතුය. ඒ අතර, ආධිපත්‍යයික ආකාරයේ පාලන තන්ත්‍ර මාධ්‍යයේ නිදහසට අවසර නොදේ. එසේත් නැතිනම් ආර්ථික අවශ්‍යතාවන් මාධ්‍ය පරිහරණයේ වර්ධනය වළක්වන තෙක් එම තත්ත්වය පවතී.

අනික් අතට බලන කල, වෛර භාෂා ශෛලියට නතු වී ඇති මාධ්‍යය ඔවුන්ගේ බලපෑම සීමා වී ඇති බව වටහා ගන්නේ, ඔවුන් ආමන්ත්‍රණය කරනු ලබන ප්‍රබුද්ධ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායයන් සමග වැඩුණා වූ උගත් ජනතාවකගේ ප්‍රමාණය අනුවය. ඇත්ත වශයෙන්ම, ආර්ථිකය වර්ධනය වී ඇති අවධිවල ස්ථාපිත බටහිර ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්ගෙන් ලැබෙන සාක්ෂි මෙම උපකල්පනයට අනුබල දෙයි. තවදුරටත් නීතියේ ආධිපත්‍යයට ගරු කරමින් පාලනය කරනු ලබන රාජ්‍යයක ජනවාර්ගික වෛරයට හෝ නීති විරෝධී දේශපාලන ක්‍රියාවන්ට පොළඹවන මාධ්‍ය නිර්මාණ සාමාන්‍යයෙන් උසාවිවල විනිශ්චයට භාජනය වෙයි.



තහවුරු වී ඇති ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල පවා වෛරය මුසු භාෂාවේ දිගු කාලීන ප්‍රතිවිපාක සිත්වලට බලවත් සේ අහිතකර විය හැකි බවට ද සාක්ෂි සමහරවිට ඇති බව පෙනේ. මෙයට එරෙහි ව සටන් කිරීම සඳහා ගනු ලබන නීතිමය ප්‍රතික්‍රියා මාර්ග මගින් ද මතභේද හටගත හැකිය. විවිධ නීතිමය සහ දේශපාලන සම්ප්‍රදායන් ද මෙහි දී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඇමෙරිකා එක්සත් ජනපදයේ උසාවි අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සම්බන්ධයෙන් සීමාවන් පැනවීමට සාමාන්‍යයෙන් අදිමදි කරන අතර, බොහෝ බටහිර යුරෝපීය විනිශ්චය කරුවන් නාට්සි පිළිබඳව මෙන්ම අනිකුත් ඒ හා සමාන දුෂ්ට අතීතයේ සුන්බුන් ගැන වන ප්‍රචාරණයක් සැක සංකාවෙන් මුසුව සලකන බව පෙනේ.

ආර්ථික අර්බුද සහිත තත්ත්වයන් යටතේ ඉලක්කගත පාඨක, ප්‍රේක්ෂක සහ ශ්‍රාවක ජනතාවගේ බිය සහ කළමනාකාරීත්වයට ඇති නැඹුරුව උත්සන්න වූ අවස්ථාවල දී ඇත්ත වශයෙන්ම වෛරය අරමුණු කරගත් ප්‍රචාරණයට එතරම් ව්‍යාප්ත නොවූ මාධ්‍යයක් තිබුණේ වී නමුත් මහ ජනතාව කෙරෙහි තියුණු බලපෑමක් ඇති කරවීමට හැකියාව තිබේ. එවන් අවස්ථාවලදී ඒකාධිපතිවාදී දේශපාලන ප්‍රභූ පැලැන්තියට බලය හැසිරවීමේ තත්වයන්ට ඉතා භයානක අන්දමින් සමීපවීමට ඉඩකඩ ඇති වේ. මේ හේතුකොට ගෙන නීත්‍යානුකූල ආධිපත්‍යයට හානිකර තත්වයක් උදා වේ.

මෙහි දී ඉදිරිපත් කරනු ලබන විශ්ලේෂණාත්මක රාමුව අවම වශයෙන් ඉස්මතු විය හැකි අවස්ථා තුනක් පෙන්වා දෙයි. මෙම අවස්ථා ඉස්මතු වන්නේ අතිශය ප්‍රචණ්ඩ ආතති සහ ගැටුම්

පවතින තත්ත්වයන් යටතේ මාධ්‍යයට ක්‍රියාත්මක වීමට සිදුවීම හේතු කොට ගෙනය. සැබෑ ජීවිතයේදී මෙම සංක්‍රමණ අස්ථිර වුවත් ඒවා අදාළ තත්වයන්ට පෙර, පවතින කාලය තුළ හා පසුව මතුවිය හැකිය.

ආතති සහ ගැටුම් පිළිබඳ වාර්තා අව්‍යාජ ලෙස ස්වාධීනව සහ නිදහස් ආකාරයෙන් නිකුත් කරන අතර ම, සාධාරණව හා තුලනාත්මකව ඉදිරිපත් කරන්නේ නම් එම වාර්තාවලට ඇත්ත වශයෙන්ම ගැටුම් යටපත් කිරීමට උදව් කළ හැකිය. මේ ආකාරයෙන් තම පාඨකයන්ට සහ ශ්‍රාවකයන්ට නිදහස් මත ඇති කර ගැනීමට ඉඩ දෙමින් ජනතාව දැනුවත් කිරීමට හේතු කාරක වනවා ඇත. අනිත් අතින් බලන කල අගතිගාමී සහ පාර්ශ්වයක වාසියට හේතුවන වාර්තාවලට ඉතා පහසුවෙන් අර්බුදයක් ඇතිවීම ඉක්මන් කිරීමට මෙන්ම තීව්‍ර කිරීමට ද හැකියාව තිබේ.

රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් සම්බන්ධයෙන් සම්මුති ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවේශයේ කොටසක් වශයෙන් ක්‍රියා කිරීමට මාධ්‍යයෙන් බලාපොරොත්තු වන්නේ නම්, අනිකුත් අවශ්‍ය කොන්දේසි සහ පූර්ව කොන්දේසි සම්පූර්ණ කළ යුතුය. මේවාට ඇතුළත් වන දේ වන්නේ, ගැටුම සාමකාමී මාර්ගයෙන් නිරාකරණය කර ගැන්මට දේශපාලන ප්‍රභූ පැලැන්තියේ පාර්ශවයෙන් පැහැදිලි කැපවීමක්; නීතියේ ආධිපත්‍යයට ගරු කිරීමට ඇති කැමැත්ත; ආර්ථික ස්ථාවර භාවය; පාඨක, ශ්‍රාවක සහ ප්‍රේක්ෂක යන ඉලක්කගත පාර්ශ්වය සම්බන්ධයෙන් වූ උසස් මට්ටමේ අධ්‍යාපනයක් සහ ප්‍රජාතන්ත්‍රවාදී දැනුවත්කමක්ය. නැවත වරක් සඳහන් කළ යුත්තේ මෙම මූලික අංගයන්ගෙන් එකක් හෝ ශක්තිමත් කිරීමකට ලක්වන්නේ නම් ඒ හේතුකොට ගෙන පමණක් බලාපොරොත්තු වූ ප්‍රතිඵල ළඟා කරගත හැකිය. එය එසේ සිදුවන්නේ, අනෙකුත් ක්ෂේත්‍රවලත් ප්‍රගතියක් අත්පත් කරගෙන තිබේ නම් පමණි.



**කොටුව 2 :**
**බාහිර ප්‍රදානයන් සහ ජාතිකත්ව නොවන මාධ්‍ය කලාවේ බලපෑම**

විශේෂයෙන්ම පශ්චාත් ගැටුම් පුනරුත්ථාපන කටයුතු සම්බන්ධයෙන් ගන්නා වූ ප්‍රයත්නයන් යටතේ පවතින හා කොන්දේසි මත පාලනය වන බොහෝ සංක්‍රාන්තික රටවල ඇමෙරිකා එක්සත් ජනපදයෙන් හා බටහිර යුරෝපයෙන් ලැබෙන ආධාර රාජ්‍ය මඟින් නොවන සංවිධාන උත්පාතයක් අවුලුවා ඇත; එයට ම අනුරූපී වූ ප්‍රබල බලපෑමක් මාධ්‍ය මත ද පැටවී ඇත. උදාහරණයක් වශයෙන්, අදාළ ප්‍රදේශයේ ගැටුම්වලට දීර්ඝ කාලීන විසඳුම් ස්ථාපිත කිරීම සඳහා වන විවිධ බාහිර ප්‍රයත්නයන්හි කොටසක් වශයෙන් බොස්නියා සහ හර්සගොවිනියා රාජ්‍ය නොවන මාධ්‍යවලට විදේශ ආයෝජන සැහෙන ප්‍රමාණයක් යොමු කරන ලදී. එක් අවස්ථාවකදී මෙම කුඩා රාජ්‍යයේ සිටියේ අඩු ජනගහනයක් වුවත් බර්ලින් හෝ මෙඩ්රිඩ්වලට වඩා මාධ්‍ය මධ්‍යස්ථාන තිබුණි! මේ ආකාරයෙන් ජාත්‍යන්තර ආයතන මෙම රටේ මාධ්‍යයේ වැඩීමට සහයෝගය දුනි. බටහිර ආණ්ඩු සහ රාජ්‍ය නොවන සංවිධාන සියල්ලටම වඩා මාධ්‍යමය ප්‍රතිදානයක සැලකිය යුතු වර්ධනයක් ඇති කරලීමට හේතු කාරක විය. මෙම වර්ධනය අවාසනාවකට මෙන් මාධ්‍යමය නිෂ්පාදනයේ ගුණාත්මකභාවයේ හෝ එහි දේශපාලන බලපෑමේ සමානුරූපී

දියුණුවක් කැටිව ගියේ කලාතුරකිනි. 1995 ඩේටන් සාම සම්මුතියෙන් පසු පැවැති සියලු මැතිවරණවලදී ජාතිකත්වයට නැඹුරු වූ දේශපාලන පක්ෂවල ආධිපත්‍යය මගින් විස්තර කළ ඇති ආකාරයට සමස්ත දේශපාලන තත්ත්වය නව ජාතිකත්ව විරෝධී මාධ්‍යයේ පැතිරීමෙන් සැලකිය යුතු බලපෑමකට ලක් වී නොමැති බව පෙනේ. සියලු අංගෝපාංගයන්ගෙන් සමන්විත සහ ඉතා හොඳින් පුහුණු කරන ලද මාධ්‍යකරුවන්ට පවා තම රටේ ආර්ථික අවපාතයක් පැවතුණහොත් සහ අන්තවාදී රටේ දේශපාලන මාර්ගය තීරණය කරන තාක් කල් තම පාඨකයන් සහ ශ්‍රාවකයන් කෙරෙහි ඇති කළ හැකි බලපෑම බෙහෙවින් සුළු ය. මේ මෙසේ වුවද, වඩාත් හොඳ මාධකරුවන් පුහුණු කළහොත් සහ ඔවුන්ගේ මාධ්‍ය වඩාත් හොඳින් ශිල්පීය අංශයෙන් පරිපූර්ණ කළහොත් ඔවුන්ට දේශපාලනය, ආර්ථිකය සහ සමාජය සඳහා වන මූලශක්තීන් ශක්තිමත් කිරීමට හා සවිබල ගැන්වීමට ඇති හැකියාව පිළිබඳ වඩාත් හොඳ බලාපොරොත්තු තබාගත හැකි වනු ඇත.

**කොටුව 3 : මාධ්‍යය මගින් ප්‍රජාතන්ත්‍රවාදයට ආධාර කිරීම**



*අසාර්ථක වූ ව්‍යාපෘතියක්* : 1997 වසර ආරම්භයේදී, ඇමෙරිකානු එක්සත් ජනපද ආණ්ඩුව ක්‍රොයේසියාවේ ලිබරල් මතධාරී මාධ්‍යකරුවන් කණ්ඩායමකට. ඇමෙරිකානු ඩොලර් ලක්ෂ දෙකක් (200,000) ලබා දුන්නේය. එසේ ලබාදුන්නේ ටෙඩ්නික් (Tjednik) නම් ප්‍රවෘත්ති සඟරාවක් ආරම්භ කිරීමට හැකියාවක් ලබාදීමටය. ද සොරෝස් ඕපන් සොසයිටි ඉන්ස්ටිටියුට් (සොරෝස් විවෘත සමාජ ආයතනය) සෑහෙන ප්‍රමාණයේ අරමුදලකින් දායක විය. අවාසනාවකට මෙන් මෙම සඟරාව මාධ්‍ය ගුණ අතින් උසස් තත්ත්වයක පැවතුණ ද බලපෑම ඉතා අල්ප විය. ඉතා කෙටි කාලයකට පසු විශාල ණය බරක් හමුවේ වසා දැමීමට සිදුවිය. එහි දී පෙනී ගියේ අඩු තරමින් ඒ අවස්ථාවේදීවත් සමජාතී තත්ත්වයක සිටි ක්‍රොඒසියාවේ මහජනයා සඟරාවෙන් ලබාදුන් ආකාරයේ ජාතිකත්ව නොවන අනුශාසනාවන් ග්‍රහණය කර නොගත් බව ය.

*සාර්ථක වූ ව්‍යාපෘතියක්* : වාසනාවකට මෙන් වඩාත් ධනාත්මක උදාහරණ ඇත. බෙල්ග්‍රේඩ් නගරය පාදක කරගත් බෙටා ප්‍රවෘති නියෝජිතායතනය ඉන් එකකි. අනූවේ දශකයේ මුල් භාගයේ දී එය ආරම්භ කරන ලද්දේ එම අවධියේ දී සර්බියානු මහජනතාව තුළ පැතිරී තිබුණා වූ සමකාලීන ජාතිකත්ව රටාවට එරෙහි වූ ජනමාධ්‍යවේදීන් කීප දෙනෙකු විසිනි. බටහිර ආධාර ලබාදෙන්නන්ගේ සහයෝගයෙන් මෙම ව්‍යාපෘතිය සුළු පරිමාණයේ කළමනාකරණය සහ නව තොරතුරු තාක්ෂණය ගැන බලවත් අවධානය යොමු කරමින් සෑහෙන ප්‍රමාණයේ බලපෑමක් ඇති කළේය. පසුගිය පස් අවුරුදු කාලය

පුරා මෙම සංවිධානය අග්නිදිග යුරෝපයේ ප්‍රධානතම පුවත් නියෝජිතායතනය බවට පත් විය. එ මගින් කලාපය පුරා මෙන් ම යුරෝපයේ ඉතිරි කොටස්වලට සහ විදේශයන්හි පාරිභෝගිකයින් සිය ගණනකට ද මුද්‍රිත හා ශ්‍රව්‍ය තොරතුරු සපයන ලදී.

ආර්ථික වශයෙන් ස්ථාවර සහ දේශපාලන වශයෙන් තුලනාත්මක බවක් පවත්වාගෙන යන මාධ්‍යයක් ස්ථාපිත කිරීම, ඵලදායී නීතියේ ආධිපත්‍යයක් සහ ක්‍රියාත්මක වන වෙළෙඳපොළ ආර්ථිකයක පූර්වාවශ්‍යතාවකි. ප්‍රජාතන්ත්‍රවාදීව ක්‍රියාත්මක වන මාධ්‍යයකට ඇති අවශ්‍යතම උවමනාව වන්නේ ආණ්ඩුවේ සහ ආර්ථිකයේ ක්‍රියාකාරකම් පිළිබඳ ගැඹුරු අවබෝධයක් මහජනයාට ලැබෙන බවට සහතික වීමයි. ගැටුම් ව්‍යාවර්තනයේදී යහපත් භාවිතාවන් සහ ධනාත්මක කාර්යභාරයක් ක්‍රියාත්මක කළ හැකිවන්නේ එවිට පමණි.

# 4. ගැටුම් ව්‍යාවර්තනය සඳහා වන බාහිර ප්‍රයත්නඃ ජාත්‍යන්තර සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරකම්

## 4.1 'මාධ්‍යයේ නිදහසට' එරෙහිව 'මාධ්‍යය පාලනය' කිරීම

ගැටුමක් වැළැක්වීම සඳහා දායකවන කොන්දේසි සමහරක් ඇත. මේවා මෙසේ සම්පිණ්ඩනය කළ හැකියඃ නීතියේ ආධිපත්‍යය, ඉවසනසුලු සහ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සංස්කෘතියක් පිළිබඳ සම්ප්‍රදාය සහ මාධ්‍යයේ සංස්කෘතියක් පිළිබඳ සම්ප්‍රදාය සහ මාධ්‍යයේ (ආර්ථික) නිදහස. ගැටුම පවතින අවස්ථාවේ ජාතික යුක්තිය අනිසි ලෙස යොදාගන්නා බව පැහැදිලි වුවහොත් ජාතික දේශපාලන කමිටු මගින් සලකා බැලීමට ලක් කළ හැකි වැඩිදුර පියවර සමහරක් ජාත්‍යන්තර නීතිය සපයා දෙයි. එසේ වුවද, මේ ආකාරයේ පාදක කරුණු ජාත්‍යන්තර කමිටුවල න්‍යාය පත්‍රයන්හි නිරන්තරයෙන් සඳහන්වන නමුත් යුරෝපා කවුන්සිලය හෝ යුරෝපයේ සුරක්ෂාව සහ සහයෝගිතාවය සඳහා වූ සංවිධානය (OSCE) වැනි ආයතනවලින් සම්පාදනය කරන ලද ජාත්‍යන්තර ව පිළිගත් ලිපි ලේඛනවල දක්වා ඇති මාධ්‍ය මෙහෙයුම් නිර්ණායක අනුගමනය කිරීමට අසමත්වන ජාතික අධිකාරයන් වළකා ලීමට ගන්නා ලද සාර්ථක ප්‍රයත්න ගැන සාක්ෂි එතරම් ප්‍රමාණයක් නැත.

තත්ත්වය හැඩ ගැස්වීම සඳහා යොදාගත හැකි වැදගත් කරුණු වන්නේ ජාත්‍යන්තර ගිවිසුම් සහ දේශපාලන පාලනයක් යෙදවිය හැකි අධිකාරයන් ය. ඒ අනුව, ජාත්‍යන්තර ගිවිසුම්වල දක්වා ඇති පරමාදර්ශී තත්ත්වයන් ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන මගින් ගැටුම්වලට ලක් වී ඇති ප්‍රදේශවල ප්‍රකාශයට පත් කළ හැකිය. ප්‍රජාතන්ත්‍රවාදී මාධ්‍ය මගින් ද මෙය ඉටු කළ හැකිය. සීතල යුද්ධයේ අවසානයෙන් පසුව යුරෝපා කවුන්සලයේ සාමාජිකත්වය සහ යුරෝපයේ සුරක්ෂාව සහ සහයෝගතාව සඳහා වූ සංවිධානයේ (OSCE) රෙගුලාසි පැරණි කොමියුනිස්ට් රටවල් සම්බන්ධයෙන් විශේෂිත වූ වැදගත්කමක් ආරෝපණය කරගෙන ඇත. ඒවාහි රාෂ්ට්‍රාභ්‍යන්තර ගැටුම් ඇති විය හැකි තර්ජනයක් පවතී. පසුව යුරෝපීය සංගමයට ඇතුළත්වීම සඳහා මේ රටවලට යුරෝපා කවුන්සිලයේ දේශපාලන, නෛතික සහ අනිකුත් ප්‍රතිපත්තිවල සංකල්පනයක් වැදගත් පූර්ව අවශ්‍යතාවක් වන්නේය. එය යුරෝපා සංගමයට බද්ධවීමට ඇති ඉතා වැදගත් මාර්ගයක් වන්නේය. මෙම රටවල පශ්චාත් කොමියුනිස්ට් ප්‍රභූ පැළැන්තිය මේ

ආකාරයෙන් තම රටවල් 'තිරසාර සාම කලාපයක්' වශයෙන් යුරෝපා සංගමය තුළට ගෙන යන බවට දෙන විවිධ පොරොන්දුවලින් ඉමහත් නීත්‍යානුකූලභාවයක් ලබාගනී. ඵලදායී වශයෙන් ඔවුන්ගේ වචන සෑමවිටම පිළිගත හැක්කේ විශේෂයෙන්ම අර්බුද අවස්ථාවන්හි දී ඔවුන්ගේ රටවල ඇත්ත තත්ත්වය තම රටවල් එකඟත්වයකට පැමිණ ඇති ජාත්‍යන්තර නෛතික සහ දේශපාලන බැඳීම්වලින් අදහස් කරනු ලබන රීති සහ ප්‍රමිතීන් සමග සංසන්දනය කිරීමෙනි.

බටහිර යුරෝපීය රටවල මාධ්‍ය නිදහස උල්ලංඝනය කර ඇති බවට නැගී ඇති චෝදනා සම්බන්ධ නඩු කිහිපයක්ම මානව හිමිකම් සඳහා වූ යුරෝපීය උසාවියේ විභාග කර ඇත. යුරෝපයේ අනිකුත් ප්‍රදේශවල රාජ්‍ය අභ්‍යන්තර ගැටුම්වලට සම්බන්ධ නඩු විශාල ප්‍රමාණයක් බොහෝ නිරීක්ෂකයෝ බලාපොරොත්තු වෙති. කෙසේ වුවද, ජාත්‍යන්තර උසාවිවලදී මෙම උල්ලංඝනය කිරීම් නියමාකාරයෙන් විභාගයට ගැනීම සඳහා තව වසර කිහිපයක් ගත විය හැකිය.

ගැටුමක් කල් ඇතිව වැළැක්වීමේ අවශ්‍යතාව ගැන තම ප්‍රකාශිත විශ්වාසය අවධාරණය කිරීමට උත්සාහ ගන්නා තාක් කල් ජාත්‍යන්තර ප්‍රජාව අර්බුද ගහණ ප්‍රදේශවල මාධ්‍යයට බලපාන ප්‍රශ්න පිළිබඳව නිරන්තර අවධානයෙන් සිටිය යුතුය. භාෂණ නිදහසට සහ පුවත්පත් නිදහසට ගරු කිරීම ජාත්‍යන්තර දේශපාලනයේ ප්‍රාථමික අංශයක් විය යුතු අතර, ඒවා වැදගත්කමින් දෙවන ස්ථානයෙහිලා නොසැලකිය යුතුය. පළමු වන මාධ්‍ය විමර්ශණ නිලධාරී (ඔම්බුඩ්ස්මන්වරයා) වශයෙන් යුරෝපයේ සුරක්ෂාව සහ සහයෝගීතාව සඳහා වූ සංවිධානයට (OSCE) ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකයෙකු වන ෆ්‍රෙයිමුට් ඩුවේ පත් කිරීමත් සමගම 1997 අවසාන භාගයේ දී මේ ගැන සැලකිල්ලක් දැක්වීමට ක්‍රියා කරන ලදී.



## 4.2 ජාත්‍යන්තර නීතිය ප්‍රකාශ කරන කරුණු

1993 දී යුගෝස්ලෝවියාවේ සිවිල් යුද්ධයෙන් ලැබුවා වූ අත්දැකීම්වලට සෘජු ප්‍රතිචාරයක් වශයෙන්, ගැටුම් හා ආතති තත්වයන්ට බඳුන්වන අවස්ථාවන්හි දී මාධ්‍යයට මුහුණදීමට සිදුවන පාදක කරුණු සාකච්ඡා කිරීම සඳහා යුරෝපා කවුන්සිලය මගින් ස්ට්‍රැස්බර්ග් හි සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. මානව හිමිකම් සඳහා වන යුරෝපීය උසාවියේ නියෝජ්‍ය සභාපති රුඩොල්ෆ් බර්න්හාර්ට් මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගත්තේ රාජ්‍යයක් අර්බුද තත්ත්වයන්ට මුහුණ දෙන අවස්ථාවන්හි දී මාධ්‍යයේ ස්වාධීනත්වය සඳහා පවතින නීතිමය ආරක්ෂා ක්‍රියාමාර්ග විශ්ලේෂණය කිරීමටය (රෙල්ජික් 1998, පිටුව 102 බලන්න).

*මානව හිමිකම් ප්‍රඥප්තියේ* 10 වන වගන්තිය විශේෂයෙන්ම භාෂණ සහ පුවත්පත් නිදහස ආරක්ෂා කරයි. එයින් "ජාතික සුරක්ෂාව, භෞමික අඛණ්ඩතාවය සහ මහජන ආරක්ෂාව....." ගැන සැලකිලිමත් වෙමින් ද, ප්‍රමුඛතාවක් දිය යුතු වෙනත් කරුණු ගැන ද සලකා බලා පැහැදිලිවම මෙම නිදහසට සීමා පනැවීමට ඇති හැකියාවට අවසර ලබාදී ඇත. ඇත්ත වශයෙන්ම 15 වන වගන්තිය සඳහන් කර තිබෙන්නේ ජාතියේ "ජීවයට තර්ජනයක් එල්ල වී තිබෙන" හදිසි අවස්ථාවන්හිදී 10 වන වගන්තියෙන් ලබාදී ඇති නිදහස පිළිබඳ ක්‍රියා දාමයන්ට දැඩි සීමා පැනවීමට අවසර ඇත. එහෙත් එසේ කළ හැක්කේ ජාත්‍යන්තර නීතිය යටතේ ඉඩකඩ සලසා ඇත්නම් පමණි.

ප්‍රශ්න කරන අවස්ථාවේදී බර්න්හාර්ට් මෙම වැදගත් ප්‍රශ්නය අවධාරණය කළේය: එනම් "මාධ්‍ය නිදහස සහ අවසර දිය හැකි සීමාවන් වෙන් කරන රේඛාව විශේෂයෙන් ම ගැටුම් සහ ආතති පවත්නා අවස්ථාවලදී ඇඳිය යුත්තේ කොතැනකටද? යන්නයි. ඔහුගේ පිළිතුර වූයේ "ජන සන්නිවේදන මාධ්‍යයට සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳව මැදිහත්වීමට අවසර දිය හැකි සීමාවන්හි ප්‍රමාණය පැහැදිලි කොට පෙන්වාදීම අසීරුය" යන්නයි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරයා තීරණය කළේ කුමන තත්ත්ව යටතේ වුවද දැඩි පුවත් නිවාරණයකට අවසර නොදිය හැකි බවත් තවද පවතින මිම් කිසිවක් නෛතික පදනමක් නොමැතිව ප්‍රයෝජනයට ගත යුතු නැති බවත් ය. ඔහු වැඩිදුරටත් සඳහන් කළේ මාධ්‍යයේ නිදහස පිළිබඳ සීමාවන් කිසිවක් යුක්ති සහගත යැයි සලකා බැලීමට පෙර අතිරේක කොන්දේසි තුනක් සපුරාලිය යුතු බවයි (එම) :

- මහජන අධිකාරී මගින් පනවනු ලබන සීමාවන් සහ ඒවායේ මැදිහත්වීම් මානව හිමිකම් ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ සඳහන් අරමුණුවලට අදාළ විය යුතුය. උදාහරණයක් වශයෙන් "ජාතික සුරක්ෂාව භෞමික අඛණ්ඩතාව හෝ මහජන විනය ආරක්ෂා කිරීම."
- ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සියලුම සීමාකාරක පියවර 'අවශ්‍යය' යන පරීක්ෂණය හා ගැලපිය යුතු වේ. අද ද ජාතික අධිකාරීන් ඒවායේ අවශ්‍යතාව තීරණය කරනවා ඇත, නමුත් ඔවුන්ගේ ක්‍රියා සාධාරණ විය යුතුය. තවදුරටත්, සියලු ජාතික පැවතුම් ජාත්‍යන්තර පිරික්සුමට භාජනය විය යුතුය; ඒ හේතු කොට ගෙන මානව හිමිකම් සඳහා වූ යුරෝපීය උසාවියේ විමසා බැලීමට යටත් විය යුතුය.
- අධිකාරීන් විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග එසේ ගනු ලැබුවේ ආතති සහ ගැටුම්කාරී තත්ත්වයන් යටතේ වුවද නිදහස් උසාවිවල පාලනයෙන් පරිබාහිර නොවිය යුතුය.



පොදු හදිසි අවස්ථාවන්හි දී සහ යුද තත්ත්වයන්හි දී අධිකාරීන් බලවත් කිරීම ගැන සඳහන් 15 වන වගන්තිය බර්න්හාර්ඩ් විශේෂයෙන් පෙන්වා දෙයි. එය සාමාන්‍ය අවස්ථාවල දී ප්‍රයෝජනයට ගත යුතු 10 වන වගන්තියට වඩා දැඩි සීමාවන්ට අවසර ලබාදෙයි. හිත හදා ගනිමින් ඔහු මෙසේ ලියයි. " එවැනි හදිසි අවස්ථාවලදී ගනු ලබන ඕනෑම ක්‍රියා මාර්ගයක් පිළිබඳව මහජන අධිකාරීන්ගේ බලතල මෙන්ම සීමාවන් පැහැදිලිව සහ ඒත්තු ගන්නා ආකාරයෙන් ඔප්පු කිරීම අතිශය දුෂ්කර මෙන්ම සමහරවිට කළ නොහැකි දෙයක් වන්නේය." ඔහුගේ ප්‍රකාශයේ නිගමනය ද එම ස්වරූපය ගනී: "එවැනි අසමාන තත්ත්වයන්හි දී විනය, සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය නැවත ඇති කිරීම සඳහා සැලසුම් නොකරන ලද ඕනෑම ක්‍රියාමාර්ග පොදු අධිකාරියේ නියමිත කාර්යයෙන් බැහැරට යයි. " (රෙල්යික් 1998, පිටුව 103). ජාත්‍යන්තර පුවත්පත් නිදහස් දින (1996 මැයි 03) අවස්ථාවේ දී යුරෝපා කවුන්සිලයේ ඇමැති කමිටුව ආතති සහ ගැටුම් පවතින අවස්ථාවන්හි දී පත්‍රකලාවේදීන් ආරක්ෂා කර ගැනීම පිළිබඳව ප්‍රකාශයක් සහ නිර්දේශ නිකුත් කළේය (යුරෝපා කවුන්සලයේ ඇමැති කමිටුව 1996). ගැටුම් පවතින අවස්ථාවන්හි දී ජාතික සහ ජාත්‍යන්තර ව නීතිය හා මානුෂීය දුක් කරදර කෙරෙහි එල්ලවන උල්ලංඝන පිළිබඳව පොදු ජනතාවට අනතුරු ඇඟවීම සම්බන්ධයෙන් පුවත්පත් කලාවේදීන්ගේ කාර්යභාරයේ වැදගත්කම මෙම නිර්දේශයන් මගින් අවධාරණය කර සිටින ලදී. මේ ආකාරයෙන් මානව හිමිකම් සහ මානුෂීය දුක් කරදර සම්බන්ධයෙන් එල්ල වන වැඩිමනත් උල්ලංඝනය වළක්වාලීමට ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම හා සේවා තත්ත්වයන් පිළිබඳවත් මෙම ලේඛනයේ විස්තර කර ඇත.

නිර්දේශය හරයාත්මක වශයෙන් *මානව හිමිකම් ප්‍රඥප්තියේ* 10 වෙනි සහ 15 වෙනි වගන්තිවල විස්තරයක් පමණි. යුධ කලාපවල වාර්තා කටයුතුවල යෙදී සිටින පත්‍ර කලාවේදීන් සඳහා ප්‍රමාණවත් රක්ෂණ ආවරණයක අවශ්‍යතාව දැඩි සේ පෙන්නුම් කරන හෝඩුවාවන් කිහිපයකින් ද එම නිර්දේශයට එකතු කර ඇත. විදුලි සංදේශ මෙවලම් පාවිච්චියට ඇති බාධක ඉවත් කිරීමෙන් සහ පුවත්පත් කලාවේදීන්ගේ කාර්යභාරය පහසු කරන මෙන් ජාතික අධිකාරියෙන් දැඩි ලෙස ඉල්ලා ඇත. තමන්ගේ ආරක්ෂාවට තර්ජනයක් එල්ල වන ඕනෑම අවස්ථාවක දී පුවත්පත් කලාවේදීන්ට විශේෂ හදිසි සන්නිවේදන මාර්ගයක් භාවිත කරන ජිනීවාවේ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානවලින් හෝ වෙනත් ජාත්‍යන්තර සංවිධානවලින් ආධාර ලබාදීම පිළිබඳව මෙම නිර්දේශයේ අවධානයට ලක් කර ඇත.

**කොටුව 4: ගැටුම් හට ගැනීමට අවකාශ ඇති ප්‍රදේශවල මාධ්‍ය ආවරණය නිරීක්ෂණය කිරීම: මාධ්‍ය සඳහා වූ යුරෝපීය ආයතනය**

1992 වසර සිට මාධ්‍ය සඳහා වූ යුරෝපීය ආයතනය (ජර්මනියේ ඩසල්ඩෝෆ්හි පිහිටි රාජ්‍ය නොවන සංවිධානයක්) පෙරදිග, මධ්‍ය යුරෝපය සහ පැරණි සෝවියට් දේශයේ රටවල පාර්ලිමේන්තු ජනාධිපති සහ වෙනත් මැතිවරණ නිරීක්ෂණය කිරීම සඳහා සැලසුම් කරන ලද මෙහෙවර 40 කට වඩා ක්‍රියාත්මක කර ඇත. යුරෝපා සංගමය සහ යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගිතාවය සඳහා වන සංවිධානය වැඩි වශයෙන් මූල්‍ය ආධාර ලබාදුන් මෙම මෙහෙවර මගින් මෙවන් අවස්ථාවල දී ආමන්ත්‍රණය කළ යුතු කරුණු සහ ඡන්ද දායකයන් මුහුණ දෙන දේශපාලන තෝරාගැනීම් සඳහා අපක්ෂපාතී සහ තුලනාත්මක ආවරණයක් සපයා දුන් බවට ඇගැයීමක් බලාපොරොත්තු විය. විශේෂයෙන්ම අලුතින් ස්ථාපනය කරන ලද ප්‍රජාතන්ත්‍රයන්හි මැතිවරණ ක්‍රියාවලියේ දී පවත්වාගෙන යනු ලබන දේශපාලන සන්නිවේදනයේ මට්ටම ප්‍රජාතන්ත්‍රයේ සමස්ත තත්ත්වය පිළිබඳ වැදගත් දර්ශකයකි.

මාධ්‍ය සඳහා වූ යුරෝපීය ආයතනය (EIM) කරනු ලබන නිරීක්ෂණ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක යන විශ්ලේෂණ ක්‍රම දෙකම ප්‍රයෝජනයට ගනියි. ගුණාත්මක විශ්ලේෂණ සඳහා කරුණු රැස් කරගනු ලබන්නේ මාධ්‍ය වෘත්තිකයන් සමග ජාත්‍යන්තර විශේෂඥයන් පවත්වන මුහුණට මුහුණ ලා කෙරෙන සාකච්ඡාවලින් සහ ඡන්ද අපේක්ෂකයන් සහ ඔවුන්ගේ නියෝජිතයන්, මහජන අධිකාරීන්, පර්යේෂකයන් සහ දේශපාලන සන්නිවේදනයේ නියැළී සිටින වෙනත් අයවලුන් සමග කෙරෙන සාකච්ඡාවලිනි. ප්‍රමාණාත්මක විශ්ලේෂණය මගින් දේශපාලන අපේක්ෂකයන් වෙනුවෙන් මිඩංගු කර ඇති කාලය සහ ඉඩකඩවල සම්පූර්ණ ප්‍රමාණය මෙන්ම වාර්තාවල අවධාරණය කිරීමේ ප්‍රමාණය (ධනාත්මක, මධ්‍යස්ථ, ඍණාත්මක) තක්සේරු කරනු ලැබේ.

මෙවැනි නිරීක්ෂණයක මූලික ප්‍රතිඵල මැතිවරණයෙන් පසුව එළැඹෙන දිනයන්හි පුවත්පත් සාකච්ඡාවක් මගින් සාමාන්‍යයෙන් දේශීය මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාවට ද ඉදිරිපත් කරනු ලැබේ. මෙහෙවර ක්‍රියාත්මක වූ රටේ මාධ්‍යයේ තත්ත්වය පිළිබඳව

සවිස්තරාත්මක සමාලෝචනයක් සහ විශ්ලේෂණයක් අවශ්‍යයෙන්ම අඩංගු වන්නා වූ අවසාන වාර්තාව සති කිහිපයකට පසුව ඉංග්‍රීසි භාෂාවෙන් සහ මැතිවරණය පැවැත් වූ රටේ භාෂාවෙන් ප්‍රකාශයට පත් කරනු ලැබේ (ප්‍රකාශවල ලේඛනයක් www.eim.org වෙබ් අඩවියෙහි දැක් වේ).

ව්‍යාපෘති මේ ආකාරයෙන් නිරීක්ෂණය කිරීම හේතු කොට ගෙන සිද්ධීන් කෙරෙහි ක්‍රම කිහිපයකින් බලපෑම් ඇති විය හැකිය. ක්ෂණික ම බලපෑම් මතු වන්නේ ප්‍රාදේශීය මහජනතාව වෙත මූලික වාර්තාව ඉදිරිපත් කිරීමත් සමගය. එය මේ පරිද්දෙන් මාධ්‍ය මගින් කවර ආකාරයකින් කටයුතු කර ඇත්ද යන්න පිළිබඳව අපක්ෂපාතී තොරතුරු ලබාගනී. තවත් ප්‍රතිඵලයක් වන්නේ ජාත්‍යන්තර ප්‍රජාව ද අලුතෙන් ස්ථාපනය කර ඇති ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්හි මාධ්‍ය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව ද විශ්වසනීය තොරතුරු ලබාගැනීමයි. ආධාර ප්‍රතිපත්ති සහ විදේශයන්හි සිට වෙනත් කටයුතු පසුව සැලසුම් කිරීම සඳහා මෙම තොරතුරු ප්‍රයෝජනවත් වන බවට සහතික විය හැකිය.

මාධ්‍ය සඳහා වූ යුරෝපා ආයතනයේ (EIM) මාධ්‍ය වාර්තා අනාගතයේ දී උද්ගත විය හැකි එක්තරා ආකාරයක ගැටුම් පිළිබඳ පූර්ව දර්ශකයක් ලෙස සැලකිය හැකිය. මෙහිදී ජනවර්ගී දේශපාලන ස්වභාවයෙන් ඇති ගැටුම් විශේෂිත වේ. දේශපාලන සන්නිවේදනය තීරණය කරනු ලබන ප්‍රධාන හා නිත්‍ය කරුණු එම වාර්තා මගින් විස්තර කෙරේ. මේවා සාකච්ඡා කරන ආකාරය ද විස්තර කරනු ලබයි. උදාහරණයක් වශයෙන් මහජන අධිකාරීන් මගින් විවේචන යටපත් කරන්නේ නම් හෝ ඔවුන් ද්වේෂ සහගත අවුස්සනසුලු දේශන ඉවසා සිටින්නේ නම් ඒවා හේතු කොටගෙන ආතති තත්ත්වයක් සහ ගැටුම් ඇතිවීමට ඉඩ තිබේ.



උදාහරණයක් වශයෙන් මාධ්‍ය සඳහා වූ යුරෝපා ආයතනය (EIM) මාර්තු 2000 පැවැත් වූ රුසියානු ජනාධිපති මැතිවරණය පිළිබඳ වූ වාර්තාවේ පෙන්වා දුන්නේ ඡන්ද ව්‍යාපාරය පවත්වා ගෙන යන අවස්ථාවේදී ව්ලැඩිමීර් පූටින් ඉතා ප්‍රබල ලෙස මාධ්‍ය ආවරණයේ ආධිපත්‍යය තමාගේ වාසියට යොදාගත් බවයි. රුසියානු පෙඩරේෂණය නීති මගින් පනවා ඇති ප්‍රමිතීන්ට, රෙගුලාසිවලට හෝ රුසියානු පෙඩරේෂණය අත්සන් කොට එකඟ වී ඇති ජාත්‍යන්තර ගිවිසුම්වලට අනුකූලව සාමාන්‍ය වාර්තා කිරීම් සිදු වූයේ නැත. මේ සම්බන්ධයෙන් ඉදිරියට කළ යුතු බොහෝ දේ තිබුණත් 2000 මැතිවරණයේ දී වාර්තා කිරීම් සම්බන්ධයෙන් තරමක ප්‍රගතියක් ලබාගෙන තිබුණි. එය ඉකුත් දෙසැම්බර් මාසයේ දී ගෙන ගිය රාජ්‍ය ඩූමා ඡන්ද ව්‍යාපාරය වාර්තා කිරීම හා ඉකුත් 1996 දී පැවැත් වූ ජනාධිපති මැතිවරණය වාර්තා කිරීම හා සසඳන විට ගැටුම්වලට තුඩු දෙන තත්ත්වය අඩු මට්ටමකින් පැවැතුණි. මහජනතාව අතුරෙන් විශාල කොටස් අවසාන තීරණය කලින් එළඹගත් තීරණයක් වශයෙන් පිළිගෙන ඇති බවක් පෙනෙන්නට තිබුණි. මාධ්‍යයේ සේවය කරන පිරිස්ද, මේ කොටසට ඇතුළත් වේ. එයට හේතුවන්නට ඇත්තේ වැඩ බලන ජනාධිපතිගේ ජනප්‍රියත්වය අනුව වූ වාසිදායක තත්ත්වයන්ය.

එසේ වුවත්, ඡන්ද ව්‍යාපාරයේ අවසාන සතියේ දී රජයේ පාලනය යටතේ පවතින රූපවාහිනී නාලිකාව වන ඕආර්ටී (ORT) නැවත වරක් 'අසම්මත මහජන සම්බන්ධතා' ක්‍රියාවලියකට අවතීර්ණ විය. එය වැඩ බලන ජනාධිපතිවරයාගේ විරුද්ධවාදීන් අපහාසයට ලක් කරමින් කටයුතු කළේය. මෙම ක්‍රියා පිළිවෙත් ජනමාධ්‍ය වෘත්තියේ සදාචාරධර්ම ප්‍රතිපත්තිවලට මූලික වශයෙන්ම පරස්පර විරෝධී විය. එපමණක් නොව රුසියාව විසින් අනුමත කරන ලද ජාත්‍යන්තර ප්‍රමිතීන් අව තක්සේරු කිරීමක් ලෙස ද සැලකිය හැකිය. මෙම පැරණි ප්‍රතිපත්ති දෙසට ආපසු යාම සහ ඒ හා සමගම ව්ලැඩිමිර් පුටින්ගේ පාලන තන්ත්‍රය, මාධ්‍යයට අදාළ ප්‍රශ්න පිළිබඳව බලය තහවුරු කරන ආකාරයේ ප්‍රවේශය ගැන සිතන බවට පැතිරෙන කනස්සල්ලට හේතුවන ලකුණු මඟින් පෙන්නුම් කරනු ලබන්නේ රුසියාවේ ප්‍රකාශන නිදහස් සහ මාධ්‍යයේ නිදහස නැති වී යාමේ තර්ජනයට මුහුණ පා ඇති බවයි. පසුව ඇති වූ වර්ධනයන් වන ප්‍රධාන පෙළේ රුසියානු මාධ්‍යවේදීන් කීප දෙනෙකුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හා හිරගත කිරීම් පෙන්නුම් කරනු ලබන්නේ මෙම අනතුරු ඇඟවීම නිවැරදි බවයි.

## 4.3 භාෂණ නිදහස සහ පුවත්පත් කලාවේදීන්ගේ අයිතිවාසිකම් සඳහා වූ රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරකම්



භාෂණ නිදහස සහ පුවත්පත් කලාවේදීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කෙරෙන සටනේ දී රාජ්‍ය නොවන සංවිධාන ඉදිරියට පැමිණ ඇත්තේ සාපේක්ෂ වශයෙන් මෑතකදීය. ශීත යුද අවධියේදී ස්ථාපනය කරන ලද දේශපාලන ක්‍රියාකාරී රාමුව තුළ යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගිතාවය සඳහා වූ සංවිධානය (OSCE) හෝ යුනෙස්කෝ (UNESCO) සංවිධානය නිරන්තරයෙන්ම (වෙනත් දේ සමග) කරළියක් වශයෙන් ක්‍රියාත්මක විය. මෙහිදී පුවත්පත් හා ලේඛන කලාවේ නිදහස ගැන සාකච්ඡා කෙරුණු ශීත යුද්ධයේ අවසානයෙන් පසුව, රාජ්‍ය නොවන සංවිධාන විශාල ප්‍රමාණයක් මෙම ක්‍රියාවලියට වැඩි වශයෙන් සහභාගී වෙමින් සිටී.

මාධ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව ගැඹුරින් කටයුතු කරන සංවිධාන අතර වඩාත් ප්‍රසිද්ධ ඒවා නම්, බ්‍රසල්ස්හි පුවත්පත් කලාවේදීන්ගේ ජාත්‍යන්තර ෆෙඩරේෂණය, පැරීසියේ මායිම් රහිත වාර්තාකරුයෝ සංවිධානය, නිව්යෝර්ක් හි පුවත්පත් කලාවේදීන් ආරක්ෂා කර ගැනීම සඳහා වූ කමිටුව, මොස්කව්හි ග්ලස්කොස්ට් ආරක්ෂා කිරීමේ පදනම, වියනාහි ජාත්‍යන්තර පුවත්පත් ආයතනය, ලන්ඩනයේ ආර්ටිකල් 19, ටොරොන්ටෝහි අදහස් ප්‍රකාශ කිරීම සඳහා වූ ජාත්‍යන්තර හුවමාරුව සහ වෙනත් බොහෝ රාජ්‍ය නොවන සංවිධාන සහ මානව හිමිකම් සංවිධානයි.

මෙම සියලු සංවිධාන පුවත් වාරණ, ප්‍රකාශයට ඇති නිදහස සහ පුවත්පත් කලාවේදීන්ගේ ස්වාධීනත්වය උල්ලංඝනය කිරීම් පිළිබඳ අනෙකුත් තොරතුරු එක්රැස් කොට ප්‍රකාශයට පත් කරයි. කවද ජාත්‍යන්තර පෙළඹුම් කණ්ඩායම් වශයෙන් ක්‍රියා කරමින් මහජන අධිකාරිය විසින් එවැනි උල්ලංඝනය කිරීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු බවට ඉල්ලා සිටී. ජාත්‍යන්තර ප්‍රජාව තුළ තමන්ගේ ස්ථාවරය

පිළිබඳ සැලකිය යුතු බලපෑමක් ඇති වීමට ඉඩ ඇති බැවින් සාමාන්‍යයෙන් ආණ්ඩු මෙවැනි හෙළි කිරීම්වලට සංවේදී වෙයි. රාජ්‍ය නොවන සංවිධාන සමූහය මගින් පුද්ගලාවරෝපණය කරන ලද ජාත්‍යන්තර සිවිල් සංවිධාන සමාජය කෙරෙන් නැගෙන විවේචන සමහරවිට ආචාර සම්පන්න නොවූ ආණ්ඩු සම්බන්ධයෙන් අතිශය අහිතකර ප්‍රතිඵල ඇති කරයි. බොහෝ විට බාහැරින් ලැබෙන වැඩිමනත් ආර්ථික ආධාර රටේ මානව හිමිකම් ක්‍රියා කලාපයට පැහැදිලි වර්ධනයක් ලබාදීමේ කොන්දේසි මත වෙයි. මාධ්‍ය නිදහසට ගරු කිරීම ද මීට අයත් වේ.

කෙසේ වුවද අර්බුද අවස්ථාවන්හි දී පුවත්පත් නිදහස සහ පත්‍ර කලාවේදීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සැලසුම් කරන ලද නීතිමය සහ දේශපාලන ආරක්ෂක ක්‍රියා මාර්ග සම්බන්ධ විවාදය බොහෝ විශ්ලේෂකයන් අප්‍රසන්න තීරණයක් කරා ගෙන ගොස් ඇත. එනම් ගැටුමක් අවසන් කිරීම සඳහා කිසියම් සැලකිය යුතු දායකත්වයක් ලබාදීම පිළිබඳව පුවත්පත් කලාවේදීන්ට සහ මාධ්‍යයට ඇත්තේ අතිශය සීමිත වූ ඍජු ක්‍රියාමාර්ගයි. මතු පිටින් පරස්පර බවක් පෙන්නුම් කළ ද ප්‍රචණ්ඩ අවස්ථාවන්හි දී මාධ්‍යයට සාමාන්‍යයෙන් සාක්ෂාත් කරගත හැකි මාධ්‍ය නිදහස සීමා සහිත වේ.

රාජ්‍යයක් ඇතුළත හටගන්නා සෑම ගැටුමක්ම වාගේ බාහිර බලවතුන්ගේ මැදිහත්වීමට ලක් වෙයි. එය තනිව ක්‍රියාත්මක වන ප්‍රධාන බාහිර බලවේගවල අභිමතය පරිදි හෝ නැත්නම් ජාත්‍යන්තර ප්‍රජාව මගින් ගනු ලබන සාමූහික ක්‍රියාමාර්ගයක ප්‍රතිඵලයක් වශයෙන් වුවද අදාළ රටේ අධිකාරීන්ට බොහෝ අවස්ථාවල දී දේශපාලන, මිලිටරි සහ වෙනත් ආකාරයේ උපකාර වෙනුවට මාධ්‍ය නිදහස පිළිබඳ ක්ෂේත්‍රයේ සහන ලබාදීමට කැමැති කරවා ගත හැකිය. උදාහරණයක් වශයෙන් යුගෝස්ලෝවියාවේ සිවිල් යුද්ධය පවතින අවධියේ දී පැවැති තියුණු විවේචනාත්මක මාධ්‍ය අවධානය සම්බන්ධයෙන් සියලු පාර්ශවයන් සාපේක්ෂව ඉවසා සිටීමෙන් මෙය පැහැදිලි වෙයි. කෙසේ වුවද අපැහැදිලි තත්ත්වයන් වශයෙන් පවතින්නේ එවැනි මාධ්‍ය සංවිධාන කෙතරම් කලක්, විශේෂයෙන්ම අර්බුද කලාපය කෙරෙහි වූ ජාත්‍යන්තර අවධානය මැකී ගිය විට පවතින්නේ ද යන්නයි.



## 4.4. බලහත්කාරයෙන් තොරතුරු අතරට යෑමේ සීමාවන්

1997 ග්‍රීෂ්ම ඍතුවේදී බොස්නියාවේ සාම ක්‍රියාවලිය ඇත්ත වශයෙන්ම ඇණහිට ගොස් තිබුණි. රාජ්‍ය තාන්ත්‍රික පියවර සහ මිලිටරිමය තර්ජන තත්ත්වය කෙරෙහි ඇති කළ හැකි බලපෑම ඉතා අල්ප බව පෙනෙන්නට තිබුණි; බොස්නියා - සර්බි නායකත්වයේ අන්ත ජාතිකවාදී කොටසේ ක්‍රියා සම්බන්ධයෙන් මෙය විශේෂිත විය. ඇත්ත වශයෙන්ම සිදු වූයේ සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ දෙයකි. සර්බි ජාතිකවාදීන්ගේ පාලනය යටතේ පවතින්නා වූ රූපවාහිනී නාලිකාවල ජාත්‍යන්තර සාම සාධක හමුදා වැඩි වශයෙන් හඳුන්වනු ලැබුවේ ආක්‍රමණික හමුදා වශයෙනි. සඳහන් කළ පරිදි නේටෝ හමුදා යුද ටැංකි ප්‍රදර්ශනය කරන විට අතරින් පතර දෙවන ලෝක මහා යුද්ධයේදී නට්සි ආක්‍රමණික හමුදා පෙන්නුම් කරන ලේඛනාගාරවලින් ලබාගත් වාර්තා චිත්‍රපටි කොටස් ප්‍රචාරය කරන ලදී. කලබලකාරී තත්ත්වයක් මතු විය (රෙල්යික් 1998 ඃ පිටුව 91 බලන්න).

එවකට ජර්මානු විදේශ අමාත්‍ය තනතුර දරූ ක්ලාවුස් කින්සෙල් බටහිර දේශපාලනඥයන් සමග එක්ව යෝජනා කළේ ජාත්‍යන්තර සාම සාධක හමුදා මගින් 'ඒක පාර්ශික, බටහිර විරෝධී, දුෂ්ට

වාර්තා කිරීම්' අඩංගු එවන් විකාශන 'අවහිර' කළ යුතු බවයි. එක්සත් ජනපද මිච්ගන් ප්‍රාන්තයේ ඩිමොක්‍රටික් පාක්ෂික සෙනෙට් සභික කාල් ලෙවින් ටික දිනකට පසු මෙම යෝජනාව තවදුරටත් ප්‍රසාරණය කළේය. එක්සත් ජනපද මිලිටරිය මගින් අයෝග්‍ය ප්‍රචාරණය මැඩ පැවැත්වීම සහ යටපත් කිරීම සඳහා ඊ- සී. 130 - ඊ කොමන්ඩෝ සෝලෝ අහස්යානා යොදාගනිමින් බොස්නියානු - සර්බියානු මහජනතාවට සෘජුවම ගුවන් විදුලි සහ රූපවාහිනී වැඩසටහන් විසුරුවා හැරීමට තම හැකියාවන් යොදාගත යුතු බව ඔහු පෙන්වා දුන්නේය. එක්සත් ජනපදය මේ වන විට සාර්ථක අන්දමින් මේ ආකාරයේ ක්‍රම ග්‍රෙනාඩා, ඉරාකය සහ හෙයිටි වල යොදාගෙන තිබුණි (එම).

සති කිහිපයකට පසුව බොස්නියාවේ ජාත්‍යන්තර සාම සාධක හමුදා වැදගත් විකාශන මධ්‍යස්ථාන අත්පත් කර ගැනීමට ක්‍රියා කළේය. එම ඒකාග්‍ර ප්‍රයත්නයේ අභිප්‍රාය වූයේ සමහර නරකම 'වැරදිකරුවන්' ගුවන් අවකාශයෙන් ඉවත් කිරීමයි. එසේ වුවද ඉන් ටික කලකට පසුව බොස්නියානු - සර්බි ජනරජයේ පාර්ලිමේන්තු මැතිවරණවල දී රැඩිකල් ජාතිකත්වවාදී පක්ෂවලට තම තත්ත්වය තහවුරු කර ගැනීමට හැකිවිය. මෙසේ හැකි වූයේ ඔවුන්ගේ විකාශන ප්‍රචාරණය විසුරුවා හැරීම ජාත්‍යන්තර සාම සාධක හමුදා මගින් සෑහෙන ප්‍රමාණයකට සීමා කර තිබියදීය. බොස්නියා සහ හර්සගොවීනා මැතිවරණවල දී ජනවාර්ගික-ජාත්‍යාලයෙන් ඇලලී ගිය දේශපාලන පක්ෂවල ශක්තිය ඩේටෝන් සාම සම්මුතිවලින් වසර පහකට පසුවත් සිඳී බිඳී නොගිය තත්ත්වයක පැවතුණි. මෙසේ සිදු වූයේ මාධ්‍යයට ලබාදුන් සෘජු සහයෝගය ඇතුළුව ජාතිකත්ව විරෝධී සමාජ හා දේශපාලන වැඩසටහන්වලට විදේශ පරිත්‍යාග අතිවිශාල ප්‍රමාණයෙන් ආයෝජනය කිරීමක් ද තිබිය දී ය.



ඒ අතර ම විවෘත ව ක්‍රියා කරන ජාතිකත්වවාදී ප්‍රකාශන මාර්ග වසා දැමීම වැනි නිෂේධනාත්මක සම්බාධක මාධ්‍යයට එරෙහිව පනවන ලදී. ගැටුම් සහ යුද අවස්ථාවල දී මේ ආකාරයෙන් මාධ්‍ය කෙරෙහි බලහත්කාරයෙන් මැදිහත්වීමේ අදහස අලුත් දෙයක් නොවේ. වඩාත් මෑතක දී නවීන විද්‍යුත් මාධ්‍ය පුළුල් පරාසයක් තුළ පැතිරීම සහ තොරතුරු තාක්ෂණයේ කඩිනම් සංවර්ධනය හේතු කොට ගෙන අතිශයින් දියුණු වූ සංකීර්ණ ප්‍රවෘත්ති පද්ධති නිර්මාණය කිරීමට ඇත්ත වශයෙන්ම හැකියාවක් ඇති බවට විශ්වාසයක් ලබා දී ඇත. මෙම පද්ධති ඉලක්ක කරගනු ලබන්නේ දේශපාලන සහ මිලිටරි අංශ යන සංකලනයක මාර්ගයෙන් ගැටුම් ඉවත් කිරීමට හෝ අවම වශයෙන් ව්‍යාවර්තනය කිරීමටය.

මේ ආකාරයේ 'තොරතුරු කෙරෙහි මැදිහත්වීම' පිළිබඳව 1997 දී එක්සත් ජනපදයේ '*විදේශ කටයුතු*' නම් බලසම්පන්න සඟරාවේ කලාප කිහිපයකම දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී (මෙට්සල් 1997). මානව හිමිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් මිලිටරි වශයෙන් මහා පරිමාණ සටනක් කිරීමට ප්‍රධාන පෙළේ බලවතුන් පැහැදිලිවම එතරම් කැමැත්තක් නොදක්වන බැවින් කතුවරයා යෝජනා කරන්නේ රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් සඳහා විශේෂයෙන් සැකසුනා වූ එක්සත් ජාතීන්ගේ තොරතුරු කෙරෙහි මැදිහත්වීමේ නිදහස් ඒකකයක් නිර්මාණය කළ යුතු බවයි. මෙවැනි ඒකකයකින් ප්‍රධාන කාර්යභාරයන් තුනක් එම යෝජනාව අපේක්ෂා කරයිඃ ඒවා නම්, අර්බුද ඇළලී ගිය ප්‍රදේශයන්ගෙන් ලබාදෙන ප්‍රවෘත්ති නිරීක්ෂණය කිරීම : සාම ප්‍රවර්ධන වාර්තා විකාශනය කිරීම - සාම විකාශන සහ සීමාව ඉක්මවා ගිය අවස්ථාවලදී, වෛරය හා යුද්ධය පිළිබඳ ප්‍රචාරණය නැවැත්වීම සඳහා ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශනයන්ට අවහිර කරමින් බාධා පැමිණ වෙයි.

රුවන්ඩා ගැටුමේදී කල්වේලා ඇතිව ගෙනගිය 'සත්‍ය පැතිරවීමේ' තොරතුරු ව්‍යාපාරය හේතුකොටගෙන බේදවාචකය ලිහිල්වීමට ඉඩ තිබුණ වග පෙරදී ජනාධිපති ක්ලින්ටන්ගෙන් පරිපාලන යාන්ත්‍රණයේ හිටපු ඉහළ පෙළේ සාමාජිකයින් දෙදෙනෙකු එම එක්සත් ජනපද සංගරාවට අදහස් දක්වා තිබුණි. ඔවුන් ස්ථිරවම පළ කර සිටි තවත් අදහසක් වූයේ 1995 ග්‍රීෂ්ම ඍතුවේ දී බොස්නියානු සර්බි හමුදාවේ සන්නිවේදන මෙවලම් වෙත ඉල්ල කරන ලද එක්සත් ජනපද ගුවන් ප්‍රහාර බොස්නියානු සර්බි ප්‍රචාරක කටයුතුවලට බාධා කිරීමෙන් අතිරේක වාසියක් අත්පත් කර ගැනීමට ඉඩ තිබුණු බවයි. ඔවුන්ගේ තර්කවලට පදනම සාර්ථක අන්දමින් මැදිහත්වීම සඳහා එක්සත් ජනපදය සතු අති මහත් අවස්ථා සැලකිල්ලට ගැනීමයි. මෙම අවස්ථා ඔවුන්ට ලැබෙන්නේ, දක්ෂ සැකසුම් සහ සන්නිවේදන ක්ෂේත්‍රයන්හි තාක්ෂණ සම්බන්ධයෙන් වූ වාසිදායක තත්ත්වය මෙන්ම චන්ද්‍රිකා මාර්ගයෙන් නිරීක්ෂණය කිරීම සහ වැඩසටහනක් ඍජුව විකාශනය කිරීමේ හැකියාව ඔවුන් සතුව තිබෙන බැවිනි. මෙම ක්‍රියාමාර්ග මිලිටරි බලයත් සමග සංකලනය වූ විට එක්සත් ජනපදයට ජනවාර්ගික ගැටුම් සාර්ථකව විසඳීමට හැකිවනවා මෙන්ම ලෝක බලවතෙකු හැටියට එම කාර්යය භාරය එලදායී අන්දමින් ව්‍යාප්ත කිරීමට සහ කලාපීය ජනවාර්ගික ගැටුම් සාර්ථක අන්දමමින් නිරාකරණය කිරීමට හැකිවන බව අවබෝධ වී ඇත.

සම්ප්‍රේෂණ යන්ත්‍ර අවහිර කිරීම හෝ නීතියේ ආරක්ෂාව අහිමි කළ පුවත් පත් කලාවේදීන් වෘත්තීමය වශයෙන් තහනමට ලක් කිරීම වැනි මෙවැනි බලයෙන් නම්මා ගැනීමේ ක්‍රියාවල පදනම වන්නේ බාහිර තොරතුරු කෙරෙහි බලපෑම් ඇති කිරීමටයි. මෙම කරුණු සහ ඉහත ඡේදයේ සඳහන් ක්‍රියා මාර්ග ඇති කරනු ලබන්නේ සීමිත බලපෑමක් බව මට ඒත්තු ගොස් තිබේ. ඇත්ත වශයෙන්ම වෛරය පදනම් කරගත් ප්‍රචාරක කටයුතු අර්ධ වශයෙන් මර්දනය කළ හැකිය. නමුත් 'ප්‍රජාතන්ත්‍රවාදය නම් වූ මෘදු පැළය' බලයෙන් ගෙන ගොස් වෙනත් තැනක රෝපණය කළ හැකි ද යන්න අතිශයෙන්ම සැක සහිතය. බාහිර සම්ප්‍රේෂණ යන්ත්‍ර මගින් විකාශන පතුරුවා හැරීම වැනි ක්‍රියාකාරීත්වයට නැඹුරු වූ කටයුතුවල දිගුකාලීන බලපෑම පවා ප්‍රශ්න කිරීමට විවෘතව පවතී. මාධ්‍ය සන්නිවේදනය නිරන්තරයෙන් ම ජාතික සංස්කෘතියේ ප්‍රකාශනයක් වන බැවින් ග්‍රාහක රටේ භාෂාවෙන් වැඩසටහන් බැහැරින් විකාශනය කිරීමේ දී කිසිවිටෙක විශ්වසනීයත්වය අත්පත් කර ගැනීම සහ අදාළ රට නිජබිම කරගත් මාධ්‍ය ද්‍රව්‍යවල තත්ත්වය ළඟා කරගත නොහැකිය.

ආයුධ සන්නද්ධ ගැටුම් පැතිරී ඇති අවස්ථාවල දී සහ අභ්‍යන්තර අධිකාරීන් මාධ්‍ය කෙරෙහි විවෘතව හෝ වක්‍ර අන්දමින් වාරණයක් පැන වූ විට කවර හෝ මූලයකින් ලැබෙන තොරතුරුවලට වැදගත් තත්ත්වයක් ලැබෙන බව සත්‍යයක් වන අතර, එම තත්ත්වය සාපේක්ෂ වශයෙන් පවතින්නේ කෙටි කාලයකට පමණි. මෙයට අමතරව බාහිර විකාශන ඉතිහාසය ඉතා පැහැදිලිව පෙන්නුම් කරන පරිදි විදේශයක සකස් කරනු ලබන මධ්‍යස්ථ තොරතුරු පවා බොහෝ ග්‍රාහකයන් විසින් සලකනු ලබන්නේ ඒවා සකස් කරනු ලබන රටේ දේශපාලන උපක්‍රමවල ප්‍රකාශන ලෙස පමණක් බවයි.

ප්‍රතිපත්තියක් වශයෙන් ක්ෂණික සහ ආපසු හැරවිය නොහැකි තත්වයක් සඳහා වූ ප්‍රශස්ත තත්වයන් ළඟා වන්නේ මහා පරිමාණයේ අර්බුද සහ ප්‍රචණ්ඩ ගැටුම් අවසානයේය. මෙවැනි තත්ත්වයක් දෙවැනි ලෝක මහා යුද්ධය අවසානයේ දී ජර්මනියේ කොන්දේසි විරහිත යටත්වීමෙන් පසුව සහ සෝවියට් දේශය බිඳවැටීමෙන් පසුව යුරෝපයේ පැරණි සමාජවාදී රටවල් බොහොමයක ඇති වූ පසුව

ඇති වුණි. එවැනි තත්ත්වයක් යටතේ ජනතාවගේ අතිමහත් බහුතර වෙනසකට එකඟත්වය දක්වන අතර ඉහත දී බලවත්ව සිටි අයගේ පාර්ශ්වයෙන් එල්ල වන විරෝධය ඉතා අල්පය.

නමුත් මෑත වර්ෂවල දී යුරෝපය සහ ලෝකයම තදබල ලෙස කම්පනයට පත් කළ රාජ්‍ය අභ්‍යන්තර ජනවාර්ගික දේශපාලන ගැටුම් ප්‍රභේදයන් පැහැදිලි නිරාකරණ තත්වයකින් අවසන් වන්නේ කලාතුරකිනි. බොස්නියානු සහ චෙස්නියානු සාම ගිවිසුම් ඉතා පැහැදිලිව කියා පෑ ආකාරය උදාහරණ වශයෙන් දැක්විය හැකිය. අර්බුදයට යාම ජීවිතයේ සියලු අංශ කෙරෙහි නිත්‍ය සහ තීරණාත්මක බලපෑමක් ඇති කිරීමට බොහෝ සෙයින් ඉඩ ඇත. බලධාරීහු මාධ්‍ය කෙරෙහි දේශපාලන සහ ආර්ථික පාලනය පවත්වාගෙන යමින් හා ගැටුම් තීව්‍ර කරමින් සිටින අතරම පක්ෂපාතී වාර්තා මාර්ගයෙන් සමාජමය පක්ෂපාතකම උග්‍ර තත්ත්වයකට පත් කරති. මේ අනුව මාධ්‍ය නිත්‍ය ගොදුරක් බවට පත්වෙයි.

ප්‍රචණ්ඩත්වයට යොමු නොවී අනාගත ගැටුම් සාර්ථකව නිරාකරණය කර ගැනීමේ මාර්ගයක් වශයෙන් පශ්චාත් යුද සමාජය වෙනස් කිරීමෙන් සාමය ආරක්ෂා කිරීම අරමුණ විය යුතුය. ඉතා පැහැදිලි කරුණක් වන්නේ දේශපාලනය, ආර්ථිකය, මාධ්‍ය, සමාජය සහ ඒ සියල්ලටම වඩා අධ්‍යාපනය සම්බන්ධ කරගත් සියලුම පෙරමුණුවල දෘඩි ක්‍රියාමාර්ග සහ මූලික ශක්තීන්ගේ බලෙන් පමණක් තිරසාර බලපෑමක් බලාපොරොත්තු විය හැකි බවයි. අවාසනාවකට මෙන් එවැනි ක්‍රියාමාර්ග විරලය.

ජාතිකත්ව මාධ්‍ය අර්බුදකාරී ප්‍රදේශවල ගැටුම් ශක්තිමත් කළ අතර බටහිර නිෂ්ක්‍රියව සිටි බව ප්‍රකාශ කිරීම කෙසේ වුවත් සාධාරණ නොවේ. යුරෝ ඩොලර් සහ ඇමෙරිකානු ඩොලර් මිලියන ගණනාවක් උපකරණ, පුහුණු සහ වෙනත් ආකාරයේ මාධ්‍ය ආධාර වෙනුවෙන් ආයෝජනය කර ඇත. කෙසේ වුවද අනුකලනය කරන ලද ක්‍රියාවලියක් කලාතුරකින්වත් නොදැකිය හැකි වූවා පමණක් නොව, උදාහරණයක් වශයෙන් යුරෝපා සංගමය සර්බියාවට තම මාධ්‍ය ආධාර වැඩි කළ නමුත් මෙම රට PHARE නම් ප්‍රජාතන්ත්‍රවාදී වැඩසටහනට සහභාගී වීම වැළැක්විය. ඊට අතිරේකව, දීර්ඝකාලීන සාමයක් ලබාගැනීමට බාහිර වූ සහයෝගයක් ලබාදීම සඳහා ඇති කැමැත්ත බොහෝ විට භූ උපායමාර්ගික සහ බල දේශපාලන හේතූන් මත වැසී යයි. මේ පිළිබඳ උදාහරණ දෙකක් පමණක් වන්නේ චෙස්නියාව සහ බොස්නියාවයි.

## 5. නිගමනය

ආතති සහ ගැටුම් පවතින බොහෝ අවස්ථාවල දී මාධ්‍ය සන්නිවේදනය ප්‍රතිව්‍යූහගත කිරීම සඳහා ප්‍රබල පරමාර්ථවලින් සමන්විත මෙහෙයුම් නිර්ණායකයන් සහ නිර්දේශ පිළියෙළ කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපෘති සාමාන්‍යයෙන් ප්‍රකෘති ලෝකයෙන් ඈත්ව පවතී. කෙසේ වුවද එක් නිගමනයක් නම් ස්ථිරයඃ යුරෝපා සංගමය, රාජ්‍ය නොවන සංවිධානය සහ අනෙකුත් බටහිර භූමිකාවේ ප්‍රමුඛයන් මෙන්ම අර්බුදවලින් ඇළලී ගිය රටවල් මගින් ද දැනටමත් ස්ථාපිත කරන ලද බොහෝ මාධ්‍ය ආධාර සහ ප්‍රජාතන්ත්‍රවාදී වැඩසටහන් අතර මනා සම්බන්ධතාවක් නොමැති වූ විට සියලු මූල පියවර මුහුණ දෙන අනතුරුදායක තත්ත්වය වනුයේ අවම සාධනීය තත්ත්වයන් යටතේ වුවද මූල්‍ය සම්පත් සෑහෙන සම්භාරයක් අපතේ යාමයි. මාධ්‍ය ආධාර ව්‍යාපෘති බහුලවීම පිළිබඳ සාක්ෂි කිසියම් නිර්ණකයක් වන්නේ නම් මෙය තවමත් ඉගෙන නොගත් පාඩමක් බව පෙනේ. ඒවායින් බලාපොරොත්තු වන්නේ

ගැටුම්වලින් ඇළලී ගිය ප්‍රදේශවල තත්ත්වය දියුණු කිරීමටය. එහෙත් බොහෝ විට අවසන් වන්නේ තරගයකිනි. ඒ අනුව එය අනවශ්‍ය දෙයක් බව ඔප්පු වෙයි.

**කොටුව 5 : යුරෝපීය මාධ්‍ය නියෝජිතායතනයේ ඉලක්ක සහ කාර්යභාර**

- පාරදෘශ්‍යතාව සහ විචාරශීලීත්වය ප්‍රවර්ධනය කිරීම
- මාධ්‍ය සාන්ද්‍රණයට එරෙහිව සටන් කිරීම සහ මත විවිධත්වය ධෛර්යමත් කිරීම
- යෝජිත ජාත්‍යන්තර මාධ්‍ය ව්‍යාපෘතිවලට ප්‍රචාරයක් ලබාදීම සම්බන්ධයෙන් කේන්ද්‍රීය නිශ්කාශන මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම
- ආධාර අවශ්‍ය රටවලින් ලැබෙන ව්‍යාපෘති ඉල්ලුම් ඇගයීම
- ඉලක්කගත රටවල මාධ්‍ය ස්වයංපෝෂිත සහ ස්වාධීන තත්ත්වය සංවර්ධනය කිරීම
- විවිධ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ඒවාට 'තත්ත්ව තිළිණයක්'' ප්‍රදානය කිරීම
- දේශපාලන ක්‍රියාවලිය තුළ පුවත්පත් කලාවේ වැදගත්කම ගැන ජනතාවගේ දැනුවත්කම වැඩි කිරීම



ජාත්‍යන්තර ප්‍රජාවට ඇත්ත වශයෙන්ම දේශපාලන ඉෂ්ටාවක් තිබේ නම්, යුරෝපීය මාධ්‍ය නියෝජිතායතනයකට නිසැකයෙන්ම විසඳුමක් ලබාදිය හැකිය. එහි මූලික කාර්යභාරය විය හැක්කේ මෙම ප්‍රදේශයේ පාරදෘශ්‍යතාව සහ විචාරශීලීත්වය ප්‍රවර්ධනය කිරීමයි. යෝජිත ජාත්‍යන්තර මාධ්‍ය ව්‍යාපෘතිවලට ප්‍රචාරයක් ලබාදීම සඳහා වන කේන්ද්‍රීය නිෂ්කාශන මධ්‍යස්ථානයක් වශයෙන් එයට කටයුතු ආරම්භ කළ හැකිය. එපමණක් නොව ආධාර අවශ්‍ය රටවලින් ලැබෙන ව්‍යාපෘති ඉල්ලීම් ඇගැයීම සම්බන්ධයෙන් ද කටයුතු කළ හැකිය. මේ ආකාරයෙන් සංකූලතාව, පුනරුක්තිය සහ නාස්තිය වළක්වාගත හැකිය.

දිගුකාලීන වශයෙන් ගත් කල යුරෝපීය නියෝජිතායතනයේ මූලික කාර්යභාරය කෙසේ වුවද, ඉලක්කගත රටවල මාධ්‍යය සංවර්ධනය සඳහා වන සාමූහික ප්‍රයත්නය ස්වයංපෝෂිත තත්ත්වයකට පත් කිරීම වෙයි. නොනවත්වාම පුණ්‍යාධාර ලබාදෙනවා වෙනුවට ජාත්‍යන්තර ප්‍රජාව එයට විකල්පයක් වශයෙන් කළ යුත්තේ ගැටුම්වලින් තර්ජිත රටවල මාධ්‍යයන්හි ආර්ථික වර්ධනය උත්තේජනය කිරීමයි. නව සංවිධානයේ නිර්දේශ පදනම් කරගෙන ලෝක බැංකුව, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන යුරෝපීය බැංකුව (EBRD), ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය සඳහා වූ යුරෝපීය සංගමයේ මාධ්‍ය වැඩසටහන හෝ වෙනත් මූල්‍යාධාර සපයන මූලාශ්‍රවලට බොහෝ කාලවල මාධ්‍යයේ නිදහස සඳහා ආර්ථික පදනමක් සපයා දිය හැකිය. ස්ථාපිත ප්‍රජාතන්ත්‍රයන්හි යුරෝපීය මාධ්‍ය නියෝජිතායතනය මගින් ආධාර කරනු ලබන සහ සම්බන්ධීකරණය කරනු ලබන ව්‍යාපෘතිවලට උදාහරණයක් වශයෙන් මාධ්‍ය කේන්ද්‍රීයකරණයට එරෙහිව කටයුතු කිරීමේ දී, උදව් කිරීම් සහ මතයන්හි විවිධත්වයක් ඇති කිරීම සඳහා ධෛර්යමත් කළ හැකි වේ.

ආර්ථික සාර්ථකත්වය අවශ්‍යයෙන්ම රඳා පවත්නේ යෝග්‍ය වූ විශේෂඥතාව සහ නිෂ්පාදනයේ තත්ත්වය මතයි. ඒ අනුව, එවැනි සම්බන්ධීකාරක සංවිධානයකට අවම වශයෙන් පුවත්පත් කලාවේදීන්, මාධ්‍ය කළමනාකරුවන් වෙනත් මාධ්‍ය වෘත්තීන් සඳහා නානාවිධ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ අවසානයේ දී කිසියම් තත්ත්ව තිළිණයක් සූදානම් කිරීම වැනි කටයුතුවලට ඉදිරිපත් විය හැකිය.

මාධ්‍ය සංවිධාන සහ අධ්‍යයන ආයතනවල සහයෝගය ඇතිව මෙම සංවිධානයට කළ හැකි තවත් එක් ක්‍රියාකාරකමක් වන්නේ මහාද්වීපයේ මාධ්‍ය සංවර්ධනය අඛණ්ඩව නිරීක්ෂණය කිරීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන්නා වූ දත්ත සමුදාය ක්‍රියාකාරී වැඩසටහන් සහ සංවිධානයේ වෙනත් ක්‍රියාකාරකම්වලට ආරම්භක තොරතුරු ලක්ෂ්‍ය වශයෙන් භාවිත කළ හැකිය.

මෙයට අතිරේක වශයෙන් යුරෝපීය මාධ්‍ය සංවිධානයට දේශපාලන ක්‍රියාවලිය ඇතුළත, විශේෂයෙන්ම ගැටුම් හා අර්බුද අවස්ථාවන්හි දී පුවත්පත් කලාවේ වැදගත්කම පිළිබඳව මහජනයා තුළ දැනුවත් බව වැඩි කිරීමට ආධාර කළ හැකිය. විශේෂයෙන්ම රාජ්‍යයේ පදනම් සෙලවෙන අවස්ථාවේ දී දේශපාලන බල කේන්ද්‍රය සහ පුවත්පත් මෙහෙයවන්නන් වශයෙන් මාධ්‍යය හසුරුවන ආකාරය තේරුම් ගැනීම ප්‍රජාව දැනුවත්වීම සම්බන්ධයෙන් වැදගත් වේ.

මෙම අවශ්‍යතාව විශේෂිත වශයෙන් හදිසි කරුණක් බවට පත්වන්නේ ගැටුම වෙනස් කළ නොහැකි තත්ත්වයකට පත් වූ විටය. ලේ හැලීම අවසානයේ දී, තත්ත්වය එසේ නොවිය යුතු වුවත්, පැරණි යුගෝස්ලෝවියාවේ සිදුවූවාක් මෙන් එක් වචනයක් තවත් වචනයක් දක්වා වැඩි වී ආපසු හැරවිය නොහැකි වන තෙක් දිග්ගැස්සී ගිය බවට විචාරකයෝ එකඟ වෙති. බලයේ සිටින අය තම ආධිපත්‍යය සමාජයේ සියලු කොටස් මත බලහත්කාරයෙන් ආරෝපණය කිරීම සහ උදාහරණයක් වශයෙන්, මාධ්‍ය නිදහස සීමා කිරීමෙන් හෝ ඉවත් කිරීමෙන් මාධ්‍යය තුළට වෛරය මුසු භාෂාවක් ඇතුළුවීම සඳහා මහා පරිමාණයේ සොරොව් විවෘත කරති. මේ හේතුවෙන් තව තවත් ප්‍රචණ්ඩත්වයේ විෂම චක්‍රයෙන් මතුවීමට පෙළඹවෙන අතර, අවසානයේ දී මුළු රටම ගිනිදැල්වලින් වෙළාගන්නා තෙක් පැතිරෙනවා ඇත. ආරම්භයේ සිට අවසානය දක්වා ගැටුමට පොළඹවන බලවේගය වන්නේ පුවත්පත් කලාවේ වචනය නොව වඩාත් පැහැදිලිව ප්‍රකාශ කළ හැකි අන්දමට එහි රාජ්‍යය සහ සමාජය කෙරෙහි බලය හසුරුවන හස්තයයි.



## 6. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියැවීම්


Carothers, Thomas 1999. *Aiding Democracy Abroad: The Learning Curve*, Washington: Carnegie Endowment for International Peace.

Connor, Walker 1994. *Ethnonationalism: The Quest for Understanding*, Princeton, NJ: Princeton University Press.

Committee of Ministers of the Council of Europe 1996. *Recommendation No. (96) 4 of th Committee of Ministers to Member States on the Protection of Journalists in Situations of Conflict and Tension*, Strasbourg: Council of Europe.

Galtung, Johan 1997. "Peace Journalism: Why, What, Who, Where, When," *in* Projektgruppe Friedensforschung, op. cit.

Gellner, Ernest 1983. *Nations and Nationalism*, New Perspectives on the Past Series, Ithaca, NY:

Cornell University Press.
Giddens, Anthony 1997. *Jenseits von Links und Rechts,* Frankfurt/Main: Suhrkamp
Hammond, Philip and Herman S. Edwards (eds.) 2000. *Degraded Capability. The Media and the Kosovo Crisis,* London: Pluto Press.
International Federation of Journalists and the Center for War, Peace and the News Media 1997. *Reporting Diversity. A Training and Resource Manual for Journalists on Covering Minorities, Inter-Ethnic- Relations and other Diversity Issues,* Brussels: IFJ.
McGoldrick, Annabel and Jake Lynch 2000. "Peace Journalism – how to do it?" *Activate*, 6-10.
McGarry, John and Brendan O‘Leary (eds.) 1993. *The Politics of Ethnic Conflict Regulation,* London: Routledge.
Metzl, Jamie F. 1997. "Information Intervention. When Switching Channels Isn‘t Enough," *Foreign Affairs* (November/December 1997).
Projektgruppe Friedensforschung 1997. *War, Nationalism, Racism and the Media. Diskussionsbeiträge der Projektgruppe Friedensforschung,* Konstanz: Universität Konstanz.
Reljic, Dusan 1998. *Killing Screens. Medien in Zeiten von Konflikten,* Düsseldorf: Droste Verlag.